සිංහල ගී පොතක්

Asoka Don Liyanage

2012

Volume 1

www.studentlanka.com

| **පටුන** | **ගායකයා / ගායිකාව** | **ගීතය** | **පිටුව** |
|---|---|---|---|
| 1. | අබේවර්ධන බාලසූරිය සුජාතා අත්තනායක | බොඳ මීදුම් කඳු රැල්ලේ | 5 |
| 2. | අමල් පෙරේරා -1 | නොරිකෝ සන් නිදියන්න | 6 |
| 3. | අමල් පෙරේරා -2 | සොඳුරි මගේ | 7 |
| 4. | අමරදේව - 1 | කරදර පොදි බැඳ | 8 |
| 5. | අමරදේව - 2 | තොට මුණ බද සිටි රුවන් මලී | 9 |
| 6. | අමරදේව - 3 | වසන්තයේ මල් | 10 |
| 7. | අමරසිරි පීරිස් - 1 | අවසන් හවයද සොඳුරියේ | 11 |
| 8. | අමරසිරි පීරිස් - 2 | හන්තානට පායන සඳ | 12 |
| 9. | අමරසිරි පීරිස් - 3 | කව්රුවත් නැහැ | 13 |
| 10. | අමරසිරි පීරිස් - 4 | මගේ පුංචි රෝස මලේ | 14 |
| 11. | අමරසිරි පීරිස් - 5 | මලක් වුනේ ඇයි නුඹ මට | 15 |
| 12. | ආනන්ද සමරකෝන් සහ වී පි ලීලාවතී | ඇසේ මදුර ජීවනයේ ගීතා | 16 |
| 13. | අසංක පියමන්ත | මගේ දරු පැටව් | 17 |
| 14. | අතුල සමිතා අධිකාරී | සඳ පානක් සේ ඇවිදින් | 18 |
| 15. | සී ටි ප්‍රනාන්දු -1 | බිලිඳා නැළවේ උකුලේ | 19 |
| 16. | Centigradz - 1 | හරි තේරුමක් දෙන්නට නැතත් | 20 |
| 17. | Centigradz - 2 | පැහැසර ඔබේ ආදරේ | 21 |
| 18. | චාමික සිරිමාන්න - 1 | නුඹේ ළඟින් මම ඉන්නම් | 22 |
| 19. | චාමික සිරිමාන්න - 2 | සංසාර සිහිනයේ | 23 |
| 20. | චන්දන ලියනාරච්චි | ඇහැළ මල් පිපෙනා | 24 |
| 21. | ක්ලැරන්ස් විජේවර්ධන | ඈත එපිට හිම කන්දෙන් | 25 |
| 22. | ධර්මදාස වල්පොල | මේ සෞම්‍ය රාත්‍රිය | 26 |
| 23. | දයාන් විතාරණ | අපි ආයේ දවසක | 27 |
| 24. | දයාරත්න රණතුංග | දුරස් වන්නට | 28 |
| 25. | දීපිකා ප්‍රියදර්ශනී - 1 | මා තොටින් එන | 29 |
| 26. | දීපිකා ප්‍රියදර්ශිනි - 2 | නිමක් නැති පෙමක් | 30 |
| 27. | දේවානන්ද වෛද්‍යසේකෙර -1 | ආශා දැසින් දකිනා සිහිනේ | 31 |
| 28. | එඩ්වර්ඩ් ජයකොඩි - 1 | මේ ඉර හඳ යට හමුවී | 32 |
| 29. | එඩ්වර්ඩ් ජයකොඩි - 2 | සසරේ මහා සයුරේ | 33 |
| 30. | ගුණදාස කපුගේ - 1 | දුක හාදු දෙන රැයේ | 34 |
| 31. | ගුණදාස කපුගේ - 2 | මං මුලාවී පාර හොයාගෙන | 35 |
| 32. | හරුන් ලන්ත්‍රා සහ ඇන්ජලින් ගුණතිලක | සුළං කුරුල්ලෝ | 36 |
| 33. | එච් ආර් ජෝතිපාල - 1 | පහන් ටැඹ යට | 37 |
| 34. | එච් ආර් ජෝතිපාල - 2 | සරා සඳේ | 38 |
| 35. | ඉමාන් පෙරේරා | වසන්තයේ මල් සුපිපුණ | 39 |
| 36. | ජානක වික්‍රමසිංහ | මම ඔබේ මුහුණ කියවමි | 40 |
| 37. | කරුණාරත්න දිවුල්ගනේ - 1 | අම්මා කෙනෙක් බිරිඳක් | 41 |
| 38. | කරුණාරත්න දිවුල්ගනේ - 2 | චන්ද්‍ර කින්නර ජාතකේ | 42 |
| 39. | කරුණාරත්න දිවුල්ගනේ - 3 | ලා දළු බෝ පත් | 43 |
| 40. | කසුන් කල්හාර - 1 | ඇරඹුම ම කඳුලක් වෙලා | 44 |
| 41. | ලක්ෂ්මන් හේවාවිතාරණ - 1 | පැල දිග අහසේ | 45 |
| 42. | ලතා වල්පොල - 1 | සීන හතක් මැද | 46 |
| 43. | මාලිනි බුලත්සිංහල - 1 | රජ මැදුරක ඉපදී සිටියා නම් | 47 |


asokal@gmail.com

www.studentlanka.com

| | | | |
|---|---|---|---|
| 44. | මේකලා ගමගේ - 1 | මට දෙන්න මට දෙන්න | 48 |
| 45. | මේකලා ගමගේ - 2 | අහන් ඉන්න අහගෙන ඉන්න | 49 |
| 46. | මර්වින් පෙරේරා නීලා වික්‍රමසිංහ | සුවඳති කුසුමක | 50 |
| 47. | මිල්ටන් මල්ලවආරච්චි - 1 | කඳු පාර ඈත අයිනේ | 51 |
| 48. | නන්දා මාලිනී - 1 | අවුරුදු දෙදහස් පන්සීයක් | 52 |
| 49. | නන්දා මාලිනී - 2 | ආදරයට පිපුන මල් | 53 |
| 50. | නන්දා මාලිනී - 3 | දොර කවුළු විවර කරන | 54 |
| 51. | නන්දා මාලිනී - 4 | හේමන්තයේ දී | 55 |
| 52. | නන්දා මාලිනී - 5 | කොතැනක හෝ පිපිලා | 56 |
| 53. | නන්දා මාලිනී - 6 | මගේ නෙත් ඇයි මෙසේ | 57 |
| 54. | නන්දා මාලිනී - 7 | රට කරවන්ට නම් | 58 |
| 55. | නන්දා මාලිනී - 8 | සඳට හොරෙන් සඳ මුදුනෙන් | 59 |
| 56. | නන්දා මාලිනී - 9 | වැස්සකට ඉඩ ඇතත් | 60 |
| 57. | නිහාල් ජයවර්ධන | රොණට ඇදෙන සමනළියක | 61 |
| 58. | නිරෝෂා විරාජිනී | ඔබ ගියාම දුක මට දී | 62 |
| 59. | පියසිරි විජේරත්න අමිතා වැදිසිංහ | බැද්ද පුරා | 63 |
| 60. | රෝහණ බැද්දගේ | පොඩි හාමුදුරුවෝ නෑ | 64 |
| 61. | රෝහණ බෝගොඩ | නෙතින් නෙත බලාලා | 65 |
| 62. | රෝහණ වීරසිංහ නන්දා මාලිනී | රත්තරන් දූවේ | 66 |
| 63. | රොමේෂ් සුගතපාල | දිගු දෑස දුටුවාම | 67 |
| 64. | රොෂාන් ප්‍රනාන්දු - 1 | පුංචි ඇස් දෙක | 68 |
| 65. | රොෂාන් ප්‍රනාන්දු - 2 | දුර ඈත රටක තනිවී | 69 |
| 66. | සනත් නන්දසිරි - 1 | එදා මෙදා තුර | 70 |
| 67. | සනත් නන්දසිරි - 2 | මා හද අසපුව | 71 |
| 68. | ෂෙල්ටන් පෙරේරා | මිහිරැති වසන්ත කාලේ | 72 |
| 69. | සිසිර ඉන්ද්‍රානි සේනාරත්න | නුහුරු නුපුරුදු | 73 |
| 70. | සෝමතිලක ජයමහ - 1 | එදා වාගේ අදත් | 74 |
| 71. | සෝමතිලක ජයමහ - 2 | අවසාන සැඳා සක්මන | 75 |
| 72. | සෝමතිලක ජයමහ නීලා වික්‍රමසිංහ - 3 | පියමන් කෙරුවෙමු | 76 |
| 73. | සෝමතිලක ජයමහ - 4 | සඳ මඩලට හිනැහෙන්නට | 77 |
| 74. | සුනිල් එදිරිසිංහ - 1 | අද දීගෙක යන නුඹ මට | 78 |
| 75. | සුනිල් එදිරිසිංහ - 2 | අහස පොලොව වට පිටාව | 79 |
| 76. | සුනිල් එදිරිසිංහ සහ දීපිකා - 3 | අහසයි ඔබ මට | 80 |
| 77. | සුනිල් එදිරිසිංහ - 4 | අව පස අහසක | 81 |
| 78. | සුනිල් එදිරිසිංහ - 5 | චන්ද්‍ර මඩල බැද්ද වටින් | 82 |
| 79. | සුනිල් එදිරිසිංහ - 6 | දෙවැනි බුදුන් ලෙස | 83 |
| 80. | සුනිල් එදිරිසිංහ - 7 | දෙවොලේ නොකැළැල් | 84 |
| 81. | සුනිල් එදිරිසිංහ - 8 | දූවේ නුඹ මගෙ ප්‍රාණයයි | 85 |
| 82. | සුනිල් එදිරිසිංහ - 9 | එපා යලි හමුවෙන්න | 86 |
| 83. | සුනිල් එදිරිසිංහ - 10 | ගඟ තවම ගලයි | 87 |
| 84. | සුනිල් එදිරිසිංහ - 11 | හදේ කොතැනක | 88 |
| 85. | සුනිල් එදිරිසිංහ - 12 | හිඳීවි කොතැනක හෝ | 89 |
| 86. | සුනිල් එදිරිසිංහ - 13 | කළේ පැන් ඇත | 90 |
| 87. | සුනිල් එදිරිසිංහ - 14 | කව්රුන් ද ඔබ මගේ | 91 |
| 88. | සුනිල් එදිරිසිංහ - 15 | මේ තරම් සියුමැලිද | 92 |
| 89. | සුනිල් එදිරිසිංහ - 16 | සදාකාලික නොවූ ලෝකේ | 93 |
| 90. | සුනිල් එදිරිසිංහ - 17 | සිනහ වෙනු මැන | 94 |
| 91. | සුනිල් එදිරිසිංහ - 18 | සොයා පිළිසරණක් | 95 |
| 92. | සුනිල් එදිරිසිංහ - 19 | වියෝ වූ පසුවයි | 96 |
| 93. | තිලකසිරි ප්‍රනාන්දු ( කිත්සිරි ජයසේකර ) - | එන්න මදනලේ | 97 |
| 94. | ටී එම් ජයරත්න | සියක් ආයු ලැබ | 98 |

| | | | |
|---|---|---|---|
| 95. | ටි එම් ජයරත්න නීලා වික්‍රමසිංහ | සුදු මුතු රළ පෙළ | 99 |
| 96. | වික්ටර් රත්නායක -1 | මම තරහා නෑ | 100 |
| 97. | වික්ටර් රත්නායක -2 | නිවන් දුටු හිමි | 101 |
| 98. | වික්ටර් රත්නායක -3 | පෙම්බර මධු මගේ | 102 |
| 99. | විජය කුමාරණතුංග චන්ද්‍රලේඛා පෙරේරා | සැරයටියෙන් අපි යනෙන තුරා | 103 |
| 100. | විජය කුමාරණතුංග | රූස්ස ගහ ළඟ | 104 |
| | | | |

# අබේවර්ධන බාලසූරිය සුජාතා අත්තනායක - බොඳ මීදුම් කඳු රැල්ලේ

බොඳ මීදුම් කඳු රැල්ලේ සුරංගනා රජ දහනේ
ඔබේ සිනා කඳුළු බිඳක් හෙටත් වාසනා - හෙටත් වාසනාවන්
සිහින නදී නළ රැල්ලේ පැතුම් රුවන් රන් ඔරුවේ
ඔබේ නිමල නිද්‍රා ගී - මටත් වාසනා - මටත් වාසනාවන්

සිතක තැවුල් සංසිඳිලා මිටියාවත මල් ඉසිලා
මල් වරුසා සුවඳ සමය මටත් වාසනා - මටත් වාසනාවන්
රැහැයියන්ගේ නොනිමි නාද සැවුල් කොවුල් විහඟ ගීත
අපට අරුණු හුදකලාව හෙටත් වාසනා - හෙටත් වාසනාවන්

මාල හතක් පළඳන්නට හීන හතක් එළි වන්නට
දොළොස් මහේ පහන් එළිය මටත් වාසනා - මටත් වාසනාවන්
අනාගතය කිරුළු දරා දෙපා මුලට වඩින තුරා
ලවන් පොහන මියුරු තෙපුල් හෙටත් වාසනා -
හෙටත් වාසනාවන්

සංගීතය - සරත් දසනායක පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# අමල් පෙරේරා - නොරිකෝ සන් නිදියන්න

නොරිකෝ සන් නිදියන්න ////
නිදියන්න හොඳටම රෑ වෙලා
මට පාලු නැහැ මේ හතර රියනට
ඔබෙ ආදරේ සුදු මිනී මල් පිපිලා

ඔබට බැහැ නවතින්න මා ළඟ
යා යුතුයි හෙට ජීවිතේ සොයලා
කෝපි හල් මග බලාගෙන ඇති
යන්න ඒ වෙත මගේ මතකය අතීතෙට පවරා

ඔබට බැහැ වැලපෙන්න දින දින
කාලයේ රුදු අනසකට පිටු පා
කබුකි රංගන අලුත් වී ඇත
යන්න ඒ වෙත මගේ සෝ බර කරලියෙන් බැහැලා

නොරිකෝ සන් නිදියන්න ////

සංගීතය - සුරේෂ් මාලියද්ද පද - රවී සිරිවර්දන

අසන්න ගීතය

# අමල් පෙරේරා - සොඳුරි මගේ

සොඳුරි මගේ පන මෙන් බැඳී
මා හැර දා පලා යාවි දෝ
ගිරවිය ගියා ලු රන් කූඩුවෙන්
පැණි විළඳ නී රස වූ දා

සුනු සහලේ බත රජ බොජුනයි
පැල්පතක වුවත් පෙම් රස උතුරයි
ඔබ නැති දා මට මා නෑ
දෙවියනේ ඈ කියූ වදන්
අගේ මතකෙන් මකනු එපා

සිනිඳු කසී සළු ගෙන එන්නම්
රන් මුවා මාල ගෙන පළඳන්නම්
සෝ තැවුල් නෑ සුසුමන්
දෙවියනේ මා කියූ වදන්
අගේ මතකේ රඳනු එපා

සංගීතය පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# ආචාර්ය අමරදේව - කරදර පොදි බැඳ

කරදර පොදි බැඳ ගැල පිට පටවා
කරුමයේ කළු ගොනු පෙරටුවේ බැඳ ගෙන
මේ ජීවන මග අප යනවා
ඒ ගමනේ දුක් දාහ නිවාලන
සීපද මුවඟින් පිටවෙනවා සීපද මුවඟින් පිටවෙනවා

අප යන මේ මඟ කළු ගල් මතුවී
පය රත් වීලා බුබුළු නැඟෙන සඳ
දෑසින් කඳුලැලි පිටවෙනවා
ඒ ගමනේ දුක් දාහේ නිවාලන
සීපද මුවඟින් පිටවෙනවා

කිරිගල් පොත්තේ කන්ද නගින විට
ගම සිටිනා ඔබ හදේ ඇදෙනවා
එකෙන් ගමනට හිත දෙනවා
ඒ ගමනේ දුක් දාහේ නිවාලන
සීපද මුවඟින් පිටවෙනවා සීපද මුවඟින් පිටවෙනවා

සංගීතය - ආචාර්ය අමරදේව පද - උදයසිරි පතිරණ

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

## ආචාර්ය අමරදේව - තොට මුණ බද සිටි රුවන් මලී

තොට මුණ බද සිටි රුවන් මලී
ගඟ බිලිගත් මගෙ රුවන් මලී
ගමට සිටිය එක රුවන් මලී
ගමට වරෙන් අද රුවන් මලී

ඉර අවරට යන හැන්දෑ යාමේ
දුම්බර කඳු වැටි මුදුන් වලින්
සිහින් වලාවක් හෙමෙන් නැගීලා
මේ තොටමුණ බද රැඳී සිටී

සුදු ඔසරිය හැඳ වලා රොදින් බැස
රුවන් මලී තොටමුණට ඇදේ
කළය පුරා දිය උකුලෙ තබාගෙන
හෙමින් හෙමින් පා නගනු පෙනේ

සංගීතය - ආචාර්ය අමරදේව පද - මහගම සේකර

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# ආචාර්ය අමරදේව - වසන්තයේ මල්

වසන්තයේ මල් කැකුලක් සේ
හිනැහී හිනැහී ඔබ සිටියා

වසන්තයේ මල් පොකුරු නෙලා
ඔබ මා දෝතට ගෙනෙන තුරා
මග බලමින් මා හිටියා
සොඳුරු වසන්තේ ගෙවෙන තුරා

අහස පොළොව ගිනියම් අව්වේ
ගහකොළ මැලවෙන ගිම්හානේ
අවසානේ ඔබ ආවා

ඔබ අතැ වූ මල් එකිනෙක පරවී
සුළඟේ විසිරෙනු මා දුටුවා
සුළඟේ විසිරෙන් ඒ මල් අතරින්
ඔබගේ හද මා දුටුවා

සංගීතය - ආචාර්ය අමරදේව පද - මහගම සේකර

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# අමරසිරි පීරිස් - අවසන් හවයද සොඳුරියේ

අවසන් හවයද සොඳුරියේ මේ අප
අප හට හිමි නොවෙනා
මෙවන් දුකක් කිසිදා නොම වේවා
සසරේ සැරිසරනා

නයිල් නදිය වුව කෙලවර වේවි
සමුදුර දුටු සැනිනේ
කඳුළු ගඟට කෙළවරක් තියේදෝ
ඔබ නැති මේ ගමනේ ඔබ නැති මේ ගමනේ

දැක ගන්නටවත් ලැබේද යළි ඔබ
නෙතු පියවෙන්න කලින්
සොහොන් කොතත් මගෙ කඳුළු සලාවී
සොඳුරියේ නමින් ඔබේ සොඳුරියේ නමින් ඔබේ

සංගීතය -

පද -

අසන්න ගීතය

# අමරසිරි පීරිස් - හන්තානට පායන සඳ

හන්තානට පායන හඳ
ලස්සනයි ද කියන්න
මා නොදකින ඒ පුර හඳ
ඔබට හැකිය දකින්න

අඳුරු ලලා වහිනා කල
සරසවි බිම තෙමෙන්න
කුඩේ යටින් ඔබ යන කල
එපා තනිය දැනෙන්න

ලතා මඩුලු අත වනාවි
එපා අහක බලන්න
මා ගැන මතකය ගුලිකර
මහවැලියට දමන්න

සංගීතය - ඩෙනිස්ටෙර් පෙරේරා පද - ධම්මික බණ්ඩාර

අහන්න ගීතය



www.studentlanka.com

# <u>අමරසිරි පීරිස් - කව්රුවත් නැහැ</u>

කව්රුවත් නැහැ කව්රුවත් නැහැ
එගොඩට යන්නට එගොඩට යන්නට
ඉර ගල වැටිලා පාර දෙපැත්තේ
අඳුර ගලනවා පාරුව ඇතුලට
ලන්තරුම කෝ ඔහේ තිබුනාවේ
කව්රුවත් නැහැ කව්රුවත් නැහැ

දවසින් දවසම පාලම හැදුනා
පාලම් බොරේ හෙන හඬ ඇසුනා
කිරල කැලෑවේ කුරුළු කොබෙයියන්
ගම හැරදා යන්න ගිහින්

දෑතේ අතැඟිලි හබලට ගෙවුනා
ගෙනියන්නට බැරි මහ බර තිබුනා
මෙතුවක් නොම ගිය බර අද දවසේ
මට හිනැහීගෙන යනවා වාගේයි

සංගීතය - ආචාර්ය ප්‍රේමසිරි කේමදාස පද - හේමසිරි ගුණතුංග

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# අමරසිරි පීරිස් - මගේ පුංචි රෝස මලේ

මගේ පුංචි රෝස මලේ
මමයි නුඹේ වියපත් බඹරා
නුඹ සිහිනෙන් වත් නොදකින කුමරා
නුඹ සිහිනෙන්වත් නොදකින කුමරා

කළුවර රෑ සඳක් වගේ
අහසේ නුඹ ඉන්නවනම්
ආසයි මම නොකී කවිය නුඹට කියන්න
තරහක් නැහැ නුඹ බැස යන්න

මගේ පුංචි නවාතැනේ
ඇවිදින් සැරි සරනවා නම්
අසයි මං කවුළු පියන් ඇරලා තියන්න
තරහක් නෑ නැවිත් ඉන්න

සංගීතය - ඩෙනිස්වෙර් පෙරේරා පද - ධම්මික බණ්ඩාර

අහන්න ගීතය

asokal@gmail.com

# අමරසිරි පීරිස් - මලක් වුනේ ඇයි නුඹ මට

මලක් වුනේ ඇයි නුඹ මට
ජීවිතයට සුවඳ සලන
එනමුදු සිප ගන්නට තහනම්
විලක් වුනේ ඇයි නුඹ මට
ජීවිතයට සිසිල ඉසින
දිය දෝතක් බොන්නට තහනම්

පහන් තාරකාවක් සේ
ජීවිතයට මග කීවද
ඒ එළියෙන් මහද පහන්
දල්වනු කෙලෙසින්

සහන් ගීතිකාවක් සේ
ජීවිතයේ ගිම් නිව්වද
ඒ ගීයේ සොඳුරු වදන්
මුමුනමු කෙලෙසින්

සංගීතය - කළණි පෙරේරා පද - සමන් අතාවුදහෙට්ටි

අහන්න ගීතය

# ආනන්ද සමරකෝන් සහ වී පි ලීලාවතී - ඇසේ මදුර ජීවනයේ ගීතා

ඇසේ මදුර ජීවනයේ ගීතා නාමු අමා දහරේ
තාරපති අහසේ සුදිල්ලේවි දීප්ති විහිදමිනේ
රම්‍ය සොබා ධර්මේ

රිදී කඳන් සේ ජල දහරාවෝ
පෙනේ පෙනේ හැලි හැලි කඳු මුදුනේ
භෘන්ගයෝ නද දිදී හැසිරෙති
සෝබන මල් ගොමුවේ

හිඳ මේ ගං තිරේ මඳ වෙලා
පිනමු ඒ අම ගී දහරාවේ
ඔබයි සාගරේ මමයි තරංගා
ඒ මත සැනසෙන්නා

සංගීතය - ආනන්ද සමරකෝන් පද -

අහන්න ගීතය

asokal@gmail.com

# අසංක පියමන්ත - මගේ දරු පැටව්

මගේ දරු පැටව් අහසට දෑත දිගු කරන්
අම්ම  එයි කියා ගමටම හඬ තලයි වැරෙන්
සින්න වෙන ඉඩම මට ගොඩ ගන්න බෑ ඉතින්
යන්න නුඹ ගියා උගසට දරු සෙනේ අරන්

ඇහැළ මල් පිපුණු දෙවටේදී හමු වෙලා එදා
දුන්නු බහ නිසා නුඹටත් දුක උරුම වෙලා
අහස් යන්තරේ ගේ පැල පසු කරන් ගියා
පුංචි උන් හඬයි අම්මා බැස්සේ නෑ කියා

කන්න බෑ කියයි බත් ගුලි ලොකු වැඩියි කියයි
නින්ද නෑ කියයි මගේ මගේ කවි තාලෙ නෑ කියයි
මටත් නින්ද නෑ හිත නුඹ ගැනම ගතු කියයි
හඬන සිත නිවන මල් පැණි නැතිව බැරි හැඩයි

සංගීතය -

පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# අතුල සමිතා අධිකාරී - සඳ පානක් සේ ඇවිදින්

සඳ පානක් සේ ඇවිදින් ගම්මානෙන් මේ නගරෙට
ගංගාවක් තරමට සිහිලස පිදුවයි නුඹ මා හට
නෙත් දාහක් පසු කර විත් මට හිමි දෙනුවන දුටු විට
හඳ පානක් වුයේ නුඹ නොවේදෝ මා සිත් අහසට

දුවිලි හුළඟින් පිරුණත් ඉපදුන නගරේ
මට නුපුරුදු ගමට එන්න බෑ මේ නගරය අත් හරින්න බෑ
මගෙ උරුමය රැඳුනත් මා ලද ගම පියසේ
මේ නගරේ කූඩු වෙන්න බෑ ගම්මානය අත් හරින්න බෑ

අප දෙන්නා මුණ ගැස්වූ මේ මහ නගරේ
අතැර නුඹට ගමට යන්න බෑ මේ නගරය අත් හරින්න බෑ
මගේ සිතෙන් නුඹ සිතනා මතු යම් දවසේ
මේ නගරේ පාලු වෙන්නේ නෑ මං තනියෙන් ගමට
යන්නේ නෑ

සංගීතය -

පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# සී ටි ප්‍රනාන්දු - බිලිඳා නැළවේ උකුලේ

මේ ලෝකයේ සැමා රසේ
මුහුණේ ඔබේ බිලිඳු පුතේ මගේ
බිලිඳා නැළවේ උකුලේ හිනැහේ මල සේ කැකුළේ
මවගේ සෙනෙහේ පැතිරේ රුධිරේ කිරි ලේ ඉතිරේ

දෝත නඟා මොළවා සුර ලාළනියෝ එනවා
ගීත අසා මවගේ නොදැනී නොහැඟී දුටුවේ
තාල ගසා නටනා බිලිඳා මතුවේ මිනිසා
ලෝ දහමේ නගිනා බසිනා දුක සැප අතරේ වසනා

සැම දෙනා කැඳවා පොදු ආදරයෙන් රඟනා
මුහුණ බලා සැමගේ නොදොඩා නොහඬා හිනැහේ
ජීවිතයේ සිහිවේ සැනසීම තිබේ මුහුණේ
මෑණී පියා දෙදෙනා බඳිනා නිවසේ පහනයි බිලිඳා

සංගීතය - සී ටි ප්‍රනාන්දු

පද - ඇලන්සන් පියදාස

අහන්න ගීතය



www.studentlanka.com

# Centigradz - හරි තේරුමක් දෙන්නට නැතත්

( සුළඟ ටෙලි නාටකයෙන් )

හරි තේරුමක් දෙන්නට නැතත්
නුඹ හදට ලං වුනු ගීතයක් //

හීන එකතු කර පබැඳුව වසන්තය මත පැවරුව
අනන්තය වෙත ඉගිල්ලෙන්නට හදන
නුඹ හදට ලං වුනු ගීතයක්

හරි තේරුමක්.............

බැස නොයන මදු පුරසඳ
නිදි වරණ මගේ නෙතු ළඟ
හිනාවෙන රෑ තනියවම සිත ළඟම
නුඹ හදට ලං වුනු ගීතයක්

සංගීතය - පද -

අසන්න ගීතය

# Centigradz - පැහැසර ඔබේ ආදරේ

මන්දාරම් වැහි පොද හිරිකඩ මගේ සියොළඟ රංදාලා
උන් අප ආ ගිය මග වග තොට මතක අගුලු හැර දාලා
වාවන්නට බැරි තැන දුක් කඳ දෙනෙත් පියන් කවුළු කඩා
දොරේ ගලා ගිය උණු කඳුලැලි වියලි දෙතොල් මත වැටුනා

පැහැසර ඔබේ ආදරේ මන්දාරම් අඳුරේ වෙලී
සැඟවී ගිය ඔබේ සෙනෙහෙ හද රිද්දනවා රහසේ

මැලවුණු මගේ දෙතොලේ හී රැඳී තතු සැමගෙන් සඟවා ඉන්න
ඔබ නොමැතිව සිනහ නගනයුරු මත කියා දී යන්න
උමතුව හද විලාප දෙන හඬ අහගෙන ඉන්න
බිඳකට ඇවිදින් මගේ ළය මට ඔය සවන තියන්න

සංගීතය - තුසිත් නිරෝෂන් පද - රවින්ද්‍ර මීගම

අසන්න ගීතය



www.studentlanka.com

# චාමික සිරිමාන්න - නුඹේ ළඟින් මම ඉන්නම්

නුඹේ ළඟින් මම ඉන්නම් නුඹත් එක්ක හිනැහෙන්නම්
මට පමණක් අයිති නුඹව දෑසින් ගෙන සිප ගන්නම්

පුර හඳ නති අඳුරු රැට නුඹේ ලස්සන දිලෙන රුවට
මෙමට හොරෙන් පෙම් බඳිනා සුපෙම්වතුන් සොයා ගිහින්
මගේ ආදරේ කියලා දෙන්නම් මගේ ආදරේ කියලා දෙන්නම්

මටම අයිති මගේම වූ මගේ පුංචි ආදරියේ
අඳුරු රැක දෝතින් ගෙන මුළු හදින්ම තුරුළු කරන්
මගේ ආදරේ කියලා දෙන්නම් මගේ ආදරේ කියලා දෙන්නම්

නුඹ නිවසින් පැමිණෙන දා අඳුරු අහස යට රැක සිට
මගෙ දෝතින් නුඹව අරන් දෙඇස් වලින් තුරුළු කරන්
මගේ ආදරේ කියලා දෙන්නම් මගේ ආදරේ කියලා දෙන්නම්

සංගීතය - නාලක අංජන කුමාර පද - ලාල් හේමන්ත මාවලගේ

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# චාමික සිරිමාන්න - සංසාර සිහිනයේ

සංසාර සිහිනයේ පෙම් අප්සරා නුඹයි
මේ වසන්තය පුරා සිත ඔබට පෙම් කරයි
මං ඔබට ආදරේයි මගේ ආදරී නුඹයි

මා මලක් වගේ සිතුම් සෙනෙහසින් පිරේ
ආදරෙන් අරන් ඇවිත් තුරුළු වන්නෙමි
සඳ පාන ඔබ වැනී නිල් අහසේ නැලවුනි
මගේ නෙත් පුරා ගැලූ අනන්ත සතුට නිම නැතී

මා ඔබෙන් පැතූ පැතුම් ආදරෙන් ගෙනා
රෝස මල් යහන් ගැබේ සිහින තාරුකා
මනමාල සිත පුරා දඟකාර කම තියා
ඔබ මා ළඟින්ම නතර වෙන්න ආදරෙයි කියා

සංගීතය - පද -

අහන්න ගීතය

# චන්දන ලියනාරච්චි - ඇහැළ මල් පිපෙනා

ඇහැළ මල් පිපෙනා දෙවැට දිගේ නුඹ පිය මැන්නා
පුන් පෝය දාට සඳ විලසින් මුහුණ පෙනෙන්නා //
ඇත මෑත කොතැනක හෝ කවුරුත් නොඑනා
වැට ළඟ හිඳිමින් මං එබී බලන්නම්

වත්සුණු තැවරූ ගත මට අගේ නොවෙන්නා
වනේ පිපුන මලක් ලෙසට සුවඳ හමන්නා //
ඔමරි බැලුම් හෙලාවී මුහුණ බිමට නැවේවි

ඇහැළ මල් පිපෙනා……

බහක් නොදී ගියත් අහක බලා සිනාසී
මටම හිමී යයි මගේ සිත නිතර කියාවි //
මඟ බලමින් සැමදා ඉඳි වැට ළඟ ඉන්නම්

සංගීතය -

පද -

අහන්න ගීතය



www.studentlanka.com

# ක්ලැරන්ස් විජේවර්ධන - ඈත එපිට හිම කන්දෙන්

ඈත එපිට හිම කන්දෙන් කළු වලාව සමගින් ආ
ආදරයේ පිණි කැට පොදි
සිරිසිරි ගා සැලුනා මිනි කැට බිඳුනා

නැගුනු සීත වා රැලී නිවුණු මිහිරි ගොපලු ගී //
ලිහිණී හඬින් හඬින් මන්දාරම //
සිරිසිරි ගා සැලුනා මිනි කැට බිඳුනා

ලයට තුරුළු පාලුවෙන් මීදුමින් වෙලා ගොසින් //
හදෙහි ඇඳි පින්තාරුව //
බොඳ වෙලා ගොසින් බොඳ වෙලා ගොසින්

සංගීතය - ක්ලැරන්ස් විජේවර්ධන පද -

අහන්න ගීතය

# ධර්මදාස වල්පොල - මේ සෞම්‍ය රාත්‍රිය

මේ සෞම්‍ය රාත්‍රී ගෙවිලා යති
කිම තාම නාවේ මගේ ශ්‍රීමති

රමණී හැඟුම් පෑ උතුම් දර්ශනේ
රන් තාරකා හා ගියා සේ පෙනේ
සේපාලිකා සේපාලිකා
මාගේ අමානන්ද මේ කෝ අනේ
කිම තාම නාවේ මගේ ශ්‍රීමති

සංඛාව හර්දේහි ඒවි ගලාලා
කොයි වේලේ එදෝ කියාලා බලාලා
ආනන්ද රාත්‍රී සෞමය කාන්ති
ආදරිගේ වියෝගෙන් පෙමේ
කිම තාම නාවේ මගේ ශ්‍රීමති

සංගීතය -                    පද -

අහන්න ගීතය



www.studentlanka.com

# දයාන් විතාරණ - අපි ආයේ දවසක

අපි ආයේ දවසක හමු වෙමුද මේ අද වගේ
දැන් ඉර ගිලේයි මුහුදේ කළුවර පිපෙයි දෙපසේ
වෙන්වෙමු ඉතින් හමුවෙන සිතින්
අපි ආයේ දවසක අද වගේ

අදින් පසු ඔබ ඔබට හිමි මග
ඉතින් මා හට උරුම තනි මග
ආයෙමත් හමුවෙන තුරා
දෙතැන හිමු අපි මග බලා

තුටින් හමුවුන සුහද බව අප
අරන් යමු අපෙ මතක මැදුරට
ආයෙමත් හමුවෙන තුරා එකම දවසක ජීවිතේ

සංගීතය - පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# දයාරත්න රණතුංග - දුරස් වන්නට

දුරස් වන්නට මේ ලෙසින් ඇයි ද  අප හමු වුනේ
දුරස් වන්නට මේ ලෙසින්  මොටද අප ඉපදුනේ

අත් වැල් බැඳගෙන මං මාවත් දිග
ඔහේ ඇවිද ගිය කාලය මතකද
පුංචි ළදරියක් වගේ හුරතලෙන්
ඔබ හිනැහුණ ඒ කාලය මතකද

අනාගතේ ගැන අහස් මාලිගා
අප දෙන්නා මවු කාලය මතකද
ඔබේ පෙම්වතා ලෙසින් එදා මා
ඔබේ ළඟින් වුන් කාලය මතකද

සංගීතය -  දයාරත්න රණතුංග                පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# දීපිකා ප්‍රියදර්ශනී - මා තොටින් එන

මා තොටින් එන උතුරු සුළගේ ගිනි සිඹින මඩු පල්ලියේ
දෑස් අග මුතු කඳුළු හංගන සරෝජා මගේ දෝණියේ
වෙඩි හඬට පොඩි අකුරු ඇද වෙයි මක් කරන්නද පැන්චියේ
ගුරුතුමී මා සිසුවියයි නුඹ එත් අපි එක පන්තියේ

කර වටේ අත දමා හිනැහුණු කෝ නුඹේ පොඩි යාළුවන්
දයාවක් නැති ලෝකයක් දැක උන් ගිහින් පැන මායිමෙන්
තාත්තා හීනෙන් ඇවිත් අත වනන තුරු කඳවුරු දොරින්
කාටවත් නැති දුවේ කව්රුන් නුඹ රකීවිද සෙනෙහසින්

මන්දිරේ දොර නුඹව කැඳවයි බෙබිලා හඬනා හඬින්
මායිමේ වැට අඬ ගසයි හෙට අවි දරා රකිනා ලෙසින්
දමා ගොදුරට කෙලෙස යන්නද එත් යන්නට වෙයි ඉතින්
වරක් දැක සිත නිවා ගන්නට දුවේ ඩිංගක් හිනැහියන්

සංගීතය - පද -

අහන්න ගීතය



www.studentlanka.com

# දීපිකා ප්‍රියදර්ශිනි - නිමක් නැති පෙමක්

නිමක් නැති පෙමක් ලොව තිබේ නම් පිදුම් ලද
ඒ පෙමට නම තමයි අම්මා

ලොවම එරෙහිව නැගෙන පැයක හදවත නිවන
මහඟු ඔසු පැන් වදන පෙම්මා
ඒ පෙමට නම තමයි අම්මා

රැයට පුර හඳ ලෙසින
හිරුට සවි බල පුදන
ලොවට දෙන පෙම නොමැත නිම්මා
ඒ පෙමට නම තමයි අම්මා

සංගීතය - රෝහණ වීරසිංහ පද - රවී සිරිවර්දන

අසන්න ගීතය

# දේවානන්ද වෛද්‍යසේකෙර - ආශා දෑසින් දකිනා සිහිනේ

ආශා දෑසින් දකිනා සිහිනේ මිහිර මැකී යනවා
ඒ සිහිනේ පුතු තනිකම ඉපදී හද තුල තෙරපෙනවා

ආ මග දෑලේ පිපි මල් පරවී නෑ පල හට ගන්නේ
සිතුවිලි මීමැසි පොදි නැත මී බැඳ උන්මය රිදවන්නේ

තන්හා දෑතින් පතු මේ වරපට //
ගිලිහි බිම වැටිලා
දෛවයේ ගොනු ඇද ජීවන ගැල ගෙන ආ මඟ දිග යනවා
ඇත අතීතයේ සිහින මැදින් යලි ජීවනයට යනවා

සංගීතය - දේවානන්ද වෛද්‍යසේකෙර පද - ස්වර්ණ ශ්‍රී බණ්ඩාර

අහන්න ගීතය

# එඩ්වර්ඩ් ජයකොඩි - මේ ඉර හඳ යට හමුවී

මේ ඉර හඳ යට හමුවී ආදරයෙන්
කතා කරපු අය සෙනෙහෙ වඩපු අය
ළඟ පාතක වත් නෑ

අද නුඹ කොතැනද අද මා කොතැනද
දන්නේ නෑ නුඹ මටත් හොරා
ජීවන මහ මග සටන් වැදී ඇත
නාඳුනනා පෙම්වතුන් වෙලා

දැන හඳුනා ගත් කාලේ ඉඳලා
ලබැඳි දයාවෙන් සිටිය නිසා
අප වෙනුවෙන් අප නමින් හෙලන්නට
හෙටටත් කඳුලක් ඉතිරි වෙලා

සංගීතය -

පද -

අසන්න ගීතය



www.studentlanka.com

# <u>එඩ්වර්ඩ් ජයකොඩි - සසරේ මහා සයුරේ</u>

සසරේ මහා සයුරේ තනි වූ විට
ඔබ පහුරක් වුවා
කතරේ ජීවන ගැල පදවන දා
ඔබ තරුවක් වුවා
මා ආදර පිය ළඳුනේ

කරදර බාදක මඟ අහුරන දා
සිනා සෙමිනි ඉදිරියට ගියේ
සම්පත පොදී බැඳ දොරට වඩින සඳ
කිසිදා ඔබ නැත උඩඟු වුනේ
මා ආදර පිය ළඳුනේ

බර උසුලාගෙන යන මේ ගමනේ
සිව්මංසල් වල විඩා නිවා
ඔබ ළඟ නැති නම් ගමන නොයා හැක
අත්වැල සවියයි ඔබ ළඳුනේ

සංගීතය - පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# ගුණදාස කපුගේ - දුක හාදු දෙන රැයේ

දුක හාදු දෙන රැයේ
සිත පතුලටම වෙලා
යව්වනේ අගට විය විරහී
හද ගිලන් වෙලා

ගහ කොළද මල් පිපේ
ඇළ දොළ නිල කඩා හැලේ
පෙර දාක මිරිඟු සයුරේ
ඒ රුවට රැවටුනේ

නන්නාදුනන ලෙසේ
මග තොට යළිත් හමු වෙලා
මහ මෙර හිසින් දරා ගෙන අපි
යමු දුරස් වෙලා

සංගීතය - ගුණදාස කපුගේ පද -

අසන්න ගීතය

# <u>ගුණදාස කපුගේ - මං මුලාවී පාර හොයාගෙන</u>

මං මුලාවී පාර හොයාගෙන
හසරක් අසමින් යන ගමනේ
මං මුලාවූ සමනලියකගෙනි පාර අසා තිබුනේ

ඇයත් නොදන්නිය ඇය යන මානය
උන්හිටි තැන් මතකයේ අඩමානය
පාර කියන්නේ කෙලෙසද මා හට
ඇයටද පාරක් ඇති නැති ගානය

අප හමු වුයේ මන්දයි නොදනිමි
පාර ඇසුයේ ඇයි දැයි නොකියමි
අපේ ගමන අද නවතනු හැකි නම්
අප යන ගමනද අද මෙතනින් නිමි

සංගීතය - ගුණදාස කපුගේ පද -

අසන්න ගීතය



www.studentlanka.com

# හරුන් ලන්ත්‍රා සහ ඇන්ජලින් ගුණතිලක - සුළං කුරුල්ලෝ

සුළං කුරුල්ලෝ හෙමින් ඉගිල්ලේ
මල් සුවඳකි අර ගෙන එන්නේ
ආදර උයනේ දොරටුව හැරගෙන
ඔච්චම් කරමින් පියබන්නෙ

සීන පොතේ පිටුවක් පෙරලි ඇත
මොනවද එහි ලියවී ඇත්තේ
ආදරේ ආදරේ ආදරේ ආදරේ

සුළං කුරුල්ලෝ හෙමින් ඉගිල්ලේ
එගොඩ ගොඩේ ඇති සිහින් විමානෙට
මේ පොඩි ඔරුවේ පාවෙන්නේ

මතක ලොවේ දොර අගුලු හැරේ අද
මොනවද එහි ලියවී ඇත්තේ
ආදරේ ආදරේ ආදරේ ආදරේ

සංගීතය - ආචාර්ය ප්‍රේමසිරි කේමදාස පද -

අහන්න ගීතය



www.studentlanka.com

# එච් ආර් ජෝතිපාල - පහන් ටැඹ යට

පහන් ටැඹ යට සොහොන් කොත ළඟ
කව්ද කාටද අත වන්නේ
දෑස නිදි නැති රෑක මැදියම
ඔබේ ඉකි හඬ දෝ ඇසෙන්නේ

ඔබ වියෝවෙන් වේදනාවෙන්
හීන් හිරි පොද වැටුණු දවසක
නෑසියන් හා කරපිටින් මා
ගෙනගියා ඔබ සොහොන් පිටියට

ඒ සොහොන් කොත පෙනෙන මානේ
පුංචි කුටියක කවුළුවක් ළඟ
බලා ඉන්නෙමි සිතින් හමු වී
කියා ගන්නට සිතක බැඳි පෙම

සංගීතය - පද -

අහන්න ගීතය

# එච් ආර් ජෝතිපාල - සරා සඳේ

සරා සඳේ සිනා සේලේ ගිලිහී වැටිලා
වලා තලේ ඔබේ දෑසේ සිනහා මැවිලා
තනිවේ අඳුරේ සුසුමේ හෙළිලා

වැතිරී සීත මීදුම් පායේ හදේ වේදනා //
හඬා වැටේ එදා ඇසූ ඔබේ ගීතිකා

සරා සඳේ සිනා ......

සැඟවී ඇත මේ හිම යායේ කොහේ පාවෙලා //
මිලාන වී ගියාද ඒ සිනා වාසනා

සරා සඳේ සිනා ......

සංගීතය -                                        පද -

අහන්න ගීතය



www.studentlanka.com

## ඉමාන් පෙරේරා - වසන්තයේ මල් සුපිපුණු

වසන්තයේ මල් සුපිපුණු
සුන්දර තාවය ඉහිරුණු
හද මඩලට කවුදෝ අවා
මල් පෙති සිඹ සිනා රැගෙන
මල සිඳ බිඳ යන්ට ගියා
හද දුක ගාවා - කව්දෝ අවා

හස අංගනාවන් සේ සඳ දිය මැද කිමිදී
කිරි සිහිනෙක මා රඳවා - කොහිදෝ රැඳුනේ
නීල කැලුම් ගලා හැලෙන
ඉඳුනිල් මිණි දෑස වසා
මගේ දෝතට නැවිත් නුඹ - කොහේදෝ රැඳුනේ

හිරු මැලවුන සැන්දෑවේ අඳුරට ගුලිවී
මදු බඳුනට හාදු දිදී හිඳිනා යාමේ
නෙතු කඳුලින් බොඳ කල ඒ
අතීතයේ හීන පැලට
මා කැඳවා යන්නට නුඹ ඇයි දෝ ආවේ

සංගීතය - ඉමාන් පෙරේරා පද -

අසන්න ගීතය



www.studentlanka.com

# ජානක වික්‍රමසිංහ - මම ඔබේ මුහුණ කියවමි

මම ඔබේ මුහුණ කියවමී
එහි ඇති කවි පද මුමුනමී
සැඟවුණු පදරුත් විමසමී
නව නළු රසයෙන් සැනසෙමී

මම ඔබේ ඇසට පිවිසෙමී
නෙත් කාන්තියේ කිමිදෙමී
නිල දිය පාරට නැමි නැමී
ඉඳුවර පෙති යුග නරඹමී

මම ඔබ දෙතොලට ලං වෙමී
රතු දෙතොලේ රත ඇදගමී
සිඳුවර සුවඳේ තෙමි තෙමී
නා දළු මතුපිට සතපෙමී

සංගීතය -                                        පද -

අසන්න ගීතය

asokal@gmail.com

# කරුණාරත්න දිවුල්ගනේ - අම්මා කෙනෙක් බිරිඳක්

අම්මා කෙනෙක් බිරිඳක් වෙලා
ලොව කාට හෝ නුඹ උරුමැති
සතුටින්ද ඔබ පෙරටත් වඩා
මගේ ඉපැරණි පෙම්වතී

මමද සැමියෙකි ඇයට අවනත
දෙදරුවන් ළඟ නිවන සරතැස
කාලයේ වැලි තලාවේ
සබඳ කම් සැඟවුනාවේ

අම්මා කෙනෙක් .............

අතර මග සුනු විසුනු පැතුමක
මතක මිහිරි තාම හිත යට
පරවුනත් මල් අතීතේ
සුවඳ හදවත සනීපේ

සංගීතය - රෝහණ වීරසිංහ පද - රවී සිරිවර්දන

අසන්න ගීතය

# කරුණාරත්න දිවුල්ගනේ - චන්ද්‍ර කින්නර ජාතකේ

චන්ද්‍ර කින්නර ජාතකේ කිඳුරිය ලෙසින්
නුඹ පෙම් බැඳන් මට ලං වුනා
පෙම් බැඳන් ආ කින්නරාවි
මගෙ ළඟින් ඉඳ වෙන්වුනා

ගෙට එන්න පෙර කී කතා
උඩුගම් බලා ගියෙදෝ මෙදා
විස හී සැරේ පපුවට හෙලා
නුඹ නාටකේ වෙනසක් කළා

අත දරුවෝ ගෙන මහ ගිරිදඹේ
තනිවම නගින්නද පෙම් කළේ
කළු කාසියට හදවත් වැසේ
නුඹ සොයනවද බරණැස් පුරේ

සංගීතය - පද -

අසන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# කරුණාරත්න දිවුල්ගනේ - ලා දළු බෝ පත්

ලා දළු බෝ පත් සෙමින් සැලෙන සේ
සශෝදරා දේවි වාවනු බැරි තැන
රහසේ හැඬුවා පෙර සංසාරේ ඇසුර මතක් වී

ලේන කුලේ සිට ආ ගිය මග තොට
සිටියා නොසැලෙන පහන් ටැඹක් වී
නිවන් දකින තුරු මේ සංසාරේ
පසුපස ආවා සෙවනැල්ලක් වී

දැලි සෙනේ සිත සැලි හඬන විට
වැටි දෙපා ළඟ යශෝදරාවෝ
පිපි නිවන් මල් සාදුකාර දී
නිවී පහන් විය උදැසනක් සේ

සංගීතය - එච් එම් ජයවර්ධන පද - රඹුක්කන සිද්දාර්ථ හිමි

අසන්න ගීතය



www.studentlanka.com

# කසුන් කල්හාර - ඇරඹුම ම කඳුලක් වෙලා

ඇරඹුම ම කඳුලක් වෙලා
මා බලා ඉද්දී ඒ දිහා
ආ දුරත් දුර වැඩි නිසා
අවසානයට පෙර ඈ ගියා

දුක්බරම කවියක් ලියා
එහි පද පෙළක් අඩුවෙන් තියා
අරුත පසිඳින්නට කියා
අවසානයට පෙර ඈ ගියා

ශෝකාන්තය එන තුරා
එහි රැඳෙන්නට සිත් ඇති නියා
අනන්තය ළඟ මා දමා
අවසානයට පෙර ඈ ගියා

සංගීතය - කසුන් කල්හාර පද -

අසන්න ගීතය



www.studentlanka.com

# ලක්ෂ්මන් හේවාවිතාරණ - පැල දිග අහසේ
## ( පූජා ටෙලි නාටකයේ තේමා ගීතය )

පැල දිග අහසේ  පාට දේදුනු සේ
රැඳී නොරැඳී  මගේ මතකේ
හිඳී ඔබ රහසේ
ලබැඳි මියුලැසියේ

සිතින් මගේ සිත දරාගෙන ඔබ
ඔබ ගෙවා ආ මග ඉතින් නිම වේවි
කඳුළු ගං තෙර නතර වෙමි මම නම්
සිනහ තොටු පොළ  සොයා යනු මැන
ලබැඳි  මියුලැසියේ

කිරි සිනාවක සුවඳ කැටිවුන
සිහින ගිනි ගත් වසන්තය මිහිරි
කඳුළු ගං තෙර නතර වෙමි මම නම්
කඳුළු තොටුපොළ අතැර යනු මැන
ලබැඳි  මියුලැසියේ

සංගීතය -    පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# ලතා වල්පොල - සීන හතක් මැද

සීන හතක් මැද විමනක් සදුනයි
සීත සඳුන් සුව ඒ තුල මවුනයි
වාසනාවේ මල් හදවත පිපුනයි
ගීත නාද දෙව් ලෝකෙන් අහුනයි

නීල නුවන් ගැබ සෝක වලාවෝ
වේදනාව ගෙන අ අ හද අම්බරෝ රේ
ඇති පොරකා තෙරපී ඇඹරි
දස කඳුළු වල් රුරා වැගිරෙයි

අකාලයේ වැසි දිය අද හැලිලා
සෝක සුසුම් ගඟ ඉවුරු තලාල
වාසනාවේ මල් අකලට මැරුණයි
ප්‍රේම ලෝක රන් මන්දිර කැඩුනයි

සංගීතය - අචාර්ය අමරදේව ( චිත්‍රපටිය - ගැටවරයෝ ) පද - මඩවල එස් රත්නායක

අහන්න ගීතය



www.studentlanka.com

# මාලිනි බුලත්සිංහල - රජ මැදුරක ඉපදී සිටියා නම්

රජ මැදුරක ඉපදී හිටියා නම් නුඹත් රජෙකි පුතුනේ
හිරිකඩ බාගෙන පොල් අතු ඉගිලෙයි අද නුඹේ සිරි යහනේ
හීනෙන් හිනා නොවී මා අඬවාපන් මේ රෑ යාමේ

පුංචි පැටික්කන් මග දිග හඬවන සිල්ලර රස කැවිලි
දුව යන ඉගිලෙන විසිතුරු සෙල්ලම් යානා පෙනී පෙනී
අහක බලාගෙන මග දිග යනවිට නෑ මට වාවන්නේ
හීනෙන් හිනා නොවී මා අඬවාපන් මේ රෑ යාමේ

ඉඳහිට මොළවන ලිපත් දනී පුත කැඳ රස සුනු සහලේ
දිව බොජුනක් සේ දිව ගා ඇල්මෙන් අකුරට දිව යන්නේ
ඇඳලා කල්ගිය රෙදි වැරලී නෑ මට වාවන්නේ
හීනෙන් හිනා නොවී මා අඬවාපන් මේ රෑ යාමේ

සංගීතය - පද -

අසන්න ගීතය



www.studentlanka.com

## මේකලා ගමගේ - මට දෙන්න මට දෙන්න

මට දෙන්න මට දෙන්න මොහොතකට මට දෙන්න
ඔබේ ඇස් යට නටන පාට බින්දුවක් දෙන්න

දෙතොල් පෙති හැඩ කරන සිනා රේඛා මවන
කැඩපතක මගේ රුව මොහොතකට දකින්නට
කඳුළු බිඳු සඟවගෙන දුක දැරූ අම්මාව
දෙනෙත් මත තුරුළු කර එක වරක් සිප ගන්න

ගී කියන විහඟුන්ට රොන් උරන බඹරුන්ට
රහසේම මම සොයමි මල් පාට වූ අරුම
වැසි ඉහින අහස මත බර දරන පොළොව උඩ
මගේ හීන තබා යමි තවත් දවසක එන්න

සංගීතය - රුවන් ශ්‍රී වල්පොල පද - සෝමලතා හේරත් මැණිකේ

අසන්න ගීතය

# මේකලා ගමගේ - අහන් ඉන්න අහගෙන ඉන්න

අහන් ඉන්න අහගෙන ඉන්න
මගේ හිත මොනවද මුමුණනවා

යාය පුරා නෙක නෙක පාටින් මුදු මල් පෙති ඇහැරෙනවා
පොද වැස්සක සීතල ඇවිදින් හිතට එබෙනවා
කෝඩුකාර මල් රේණු අගින් මල් සුවඳ බෙදනවා
ඒ සුවඳින් මගේ හුස්ම රටා මවනවා

සීලි සිලියේ හමන සුළඟ කොඳුරන්නේ අපටමයි
සතුට මිසක දුක මොකටද සෙනෙහස මහමෙරයි
අමාවකේ දුක දුරලන දහසක් තරු කැට නුඹටයි
ඒ එළියෙන් දැල්වෙන ලෝකය මගෙමයි මටමයි

සංගීතය - රුවන් ශ්‍රී වල්පොල පද - සෝමලතා හේරත් මැණිකේ

අසන්න ගීතය

## මර්වින් පෙරේරා නීලා වික්‍රමසිංහ - සුවඳති කුසුමක

සුවඳති කුසුමක සුසිනිඳු පෙති මත සුවය වැනී
ඔබේ හද තුළ මට සිහිලස සැනසුම ඇතිය නිති
උකුලත නැළවෙන බිළිඳෙකු ලෙස තුරුලේ සිටිමි
මුළු ලොව මට ඇත ඔබ ළඟ සිත සුව යහන නිදී

මගේ සිත සනසන උල්පත වැනි ඔබේ සිනා රැළි
දැක මම පිබිදෙමි පුරසඳ දුටු කොඳ කැකුළු මෙනී //

මගෙ හද පිනවන ඔබේ නෙත් පවසන රහස දැනී
පන නළ ඇති තුරු නිති රැක සහනය සතුට දෙමී //

සංගීතය -
පද -

අසන්න ගීතය

asokal@gmail.com

# මිල්ටන් මල්ලවආරච්චි - කඳු පාර ඇත අයිනේ

කඳු පාර ඇත අයිනේ
සඳ රැක ඇ සිනාසේ
වේදනා සිතාරයේ ඒ ගීත රාවේ ඇසේවා
ජීවිතේ පුරා

යාලුවී දෙවැටේ එදා කී කතා අසා
පාළුවී හැඬුවා සදා මාරුතේ පවා

කඳු පාර ඇත අයිනේ .......

ගං ඉමේ මා දන් කැලේ පාසැලේ පුරා
මා සොයා අවා වගේ
වෙන් වෙලා ගියා

කඳු පාර ඇත අයිනේ .......

සංගීතය - ස්ටැන්ලි පීරිස් පද -

අහන්න ගීතය

# නන්දා මාලිනි - අවුරුදු දෙදහස් පන්සීයක්

අවුරුදු දෙදහස් පන්සීයක් දැන් - වයසයි මට මගේ දූ පුතුනේ
ලේ කිරි කර දුන් උන් ලේත් උරා බි -
ලේ කලදක් වත් නෑ දෙතනේ
දරුවොත් වැදුවා දරුවොත් හැදුවා - උන් වැඩි හරියක් සොර දෙටුවෝ
දරුවන් වූව උන් පරයන් මැරයන් - මගේ දේ කා මට වින කෙටුවෝ

උනුන් කොටවලා උගුල් අටවලා - රජ වෙති මගේ උන් හැම දාමත්
මගෙ රජ දරුවන් මගෙ ජන දරුවන් - ගැන බැලුවේ නැහැ කවදාවත්
තමන් හදෙනු මිස නංගිලා මල්ලිලා - හදන්ට ඕනෑ කමක් නැතී
ගේ දොර කනකර උගසට තියලා - වළඳත් විකුණා ගෙන බුදිති

උතුරේ දරුවන් මියැදී ඉවරයි - දකුණේ දරුවොත් මිය ඇදෙති
මගේම මහ උන් මගෙ නම විකුණා - කොටවා මගෙ දරුවන් මරති
අවුරුදු පන් දාහක් තව ඉන්නට - පරමායුෂ මට ඇති බැවිනි
මගෙ පොඩි පැටවුනි තෙපි වත්
මේ සොර මුළුවෙන් මා ගලවනු මැනවි

සංගීතය - පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# නන්දා මාලිනි - ආදරයට පිපුන මල්

ආදරයට පිපුන මල් වල සුවඳ දැනේ
ඒ මල් මෙන්ම ගහ කොළ නැත ඉතිරි වුනේ
සාගරයෙන් එහා ලොව ගැන සිහින පෙනේ
ජීවිතයක පැතුම් පමණද උරුම වුනේ

දෛවයේ සරදමින් කන කොක් හඬ ඇහිලා
ජීවන සරතැසින් නොසිතු ලෙස දැවිලා
සැමදා පැතූ සෙනෙහස සොම්නස සිඳිලා
ජීවිත කාලයම ඉන්නද පසු තවිලා

ලේ කැටි කළල රුව මව් කුස නැළවෙන්නේ
දුපත පුරා පාළුව නීති මතු වන්නේ
කකියන ඇසින් උණු කඳුලැලි නලියන්නේ
කෙදිනද හදඹරේ ඉර හඳ දිලිසෙන්නේ

සංගීතය -                                        පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# නන්දා මාලිනි - දොර කවුළු විවර කරන

දොර කවුළු විවර කරන අරුණ උදයේ
සීතල සුළඟ ඔබේ සුවඳ රැගෙන හමාවා
නිදි යහන දෙනෙත නිසල කරන මොහොතේ
රෑ සන අඳුර ඔබේ සිහින මසිත සදාවා

හද පැරි රිදුම් දිදී තෙමා වැටෙන විට සළු පිලි
විෂ හී සර පහර වැදි
දවා නැගෙන විට සෝ ගිනි
සීත ගඟුලක් වී මා දොවමින් ගලාවා

දොර කවුළු විවර කරන .......

බියකරු දිවි සටන් බිමේ පිළිරැව් දෙන විට රණගොස
තනි වී දිවි සොහොන් බිමේ
මල පොත ගෙන පෙරලන විට
මාල ගිරවකු වී මා ගයාවා

සංගීතය - පද -

අහන්න ගීතය

# නන්දා මාලිනි - හේමන්තයේ දී

වසන්තේ නිදා වුන් යොවුන් කෝකිලාවන්
ගයන්නේ සුපෙම් ගීත හේමන්තයේ දී
වසන්තේ ළපල්ලෙන් වැසී වුන් කුසුම් කැල්
නටන්නේ පිපි දැන් හේමන්තයේ දී

විලාපෙන් විඩා වී රැඳී මං තලාවේ
වැසී අන්ධකාරෙන් වැටී මං මුලාවේ
වලාවක් ලෙසින් මා ඇදෙද්දී අයාලේ
ඔබෙන් නෙත් ලැබූයේ හේමන්ත කාලේ

වසන්තේ නිදා .........

සුසුම් ලා දිවා රෑ වෙලී හුදකලාවේ
එපා වී සියල්ලන් පලා ආ වෙලාවේ
තුෂාරෙන් උදා වූ සඳක් සේ නිශාවේ
ඔබයි නෙත් සැදූයේ හේමන්ත කාලේ

සංගීතය - පද -

අහන්න ගීතය

# නන්දා මාලිනි - කොතැනක හෝ පිපිලා

කොතැනක හෝ පිපිලා යලි ඔබටම සුවඳ
ගෙනෙන්නම්
කෙදිනක හෝ වැව්ලා යලි ඔබටම
සෙවන සදන්නම්

තනි වී හිඳිනා සඳ නිදි නැති රෑ - පිපි සුවඳ
දී උනිමි ඔබේ ළඟ //
පෙති පෙති ගලවා පා යට තෙරපා
මල මැලවුයේ ඇයි

කොතැනක හෝ පිපිලා ..................

සායින් පෙළෙනා සඳ ඔබ වනයේ
විලිකුන් කර මම දුනිමි පලා එල
සුහුඹුල් ශාකා විඳ එල වැළඳු
ගස වැනසූවේ ඇයි

සංගීතය -  පද -

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# නන්දා මාලිනි - මගේ නෙත් ඇයි මෙසේ

මගේ නෙත් ඇයි මෙසේ නිබඳ මා පෙළන්නේ
මගේ සිත රවටමින් ඇයි ද මා පෙළන්නේ

නොඑන බව මේ මගෙන් යළිදු ඔබ කිසි දිනෙක
දනිමි මම ඒ නමුදු ඇයි ද නෙත් මෙසේ
මග බලා හිඳින්නේ මග බලා හිඳින්නේ
ඇයි ද මා පෙළන්නේ

නොමැති බව නගරයේ යනෙන දන අතර ඔබ
දනිමි මම ඒ නමුදු ඇයි ද මා සිත මෙසේ
ඔබ සොයා තැවෙන්නේ ඇයි ද මා පෙළන්නේ

සංගීතය - සේන වීරසේකර පද - කුලරත්න ආරියවංශ

අහන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# නන්දා මාලිනි - රට කරවන්ට නම්

රට කරවන්ට නම් - රට කරවන්ට නම්

මසුරන් ඇතුව කැටේ - වටිනා කියන දේ විකිණිය යුතුය රටේ

අමන දනන් කෑ ගැහුවත් හතර වටේ

ඒවා නොවික්කොත් අපි හැම මකර කටේ

දළදා මැදුර අධිකව මිල කළ හැකිය

සිරි මහ බෝධියේ ලන්සුව පැහැදිළිය

කළු ගල් වලට විකුණා ගෙන සීගිරිය

සීගිරි කුරුටු ගී බයිලා කළ හැකිය

රට කරවන්ට නම් ......

හෝර්ටන් තැන්න දී ක්‍රීඩා පිටියකට

පවරා සිංහ රාජය ලී මෝලකට

දුන්හිඳ ඇල්ල හරවා ජල විදුලියට

සමනල කන්ද බදු දෙමු හෝටලයකට

සංගීතය - පද -

අහන්න ගීතය

# <u>නන්දා මාලිනි - සඳට හොරෙන් සඳ මුදුනෙන්</u>

(සිරිබෝ අයියා චිත්‍රපටියෙන්)

සඳට හොරෙන් සඳ මුදුනෙන් හාවෝ ගියා
ඉරට හොරෙන් ඉර මුදුනෙන් ගිරව් ගියා
මලට හොරෙන් මල මුදුනෙන් බඹරු ගියා
අපට හොරෙන් නුඹ දෑසට නොපෙනී ගියා

වනන්තරේ වන සපු මල් පීදේවා
නිරන්තරේ පිනි වැස්සට නැවේවා
ගැල නඩයේ කිංකිනි හඬ රැව් දේවා
රෑ තුන් යමට හීනෙන් වත් හිනැහෙවා

සංගීතය - ආචාර්ය වික්ටර් රත්නායක පද - ආචාර්ය සුනිල් ආරියරත්න

අහන්න ගීතය



www.studentlanka.com

# නන්දා මාලිනි - වැස්සකට ඉඩ ඇතත්

වැස්සකට ඉඩ ඇතත් අහස් කුස දස අතට

හිරුට එපමණ කුමට පුංචි පෙදෙසක් ඇතිය

සිනා සී සිනා සී දෙතොල් ඉරි තැලෙද්දී

හඬන්නට මිසක වෙන කුමකටද නෙතු අපට

පුංචි කුහුඹුවන්ටත් තියේ උන් හෙවනැල්ල

බිඳී ගිය මුත් බඳුන් අතින් දිය බොනු හැකිය

ඔබට මා මටද ඔබ හමු වූනොතින්

සිනාසෙමු අතීතේට යම් දිනෙක අප දෙදෙන

සයුර ගොඩ එන තුරා කඳු මුදුන් ඇත උසට

ගලන ගඟ නැවත් වූ තැනින් ගම යට නොවෙද

ඔබට මා මටද ඔබ හමු වූනොතින්

සිනාසෙමු අතීතේට යම් දිනෙක අප දෙදෙන

සංගීතය -

පද -

අහන්න ගීතය



www.studentlanka.com

# නිහාල් ජයවර්ධන - රොණට ඇදෙන සමනළියක

රොණට ඇදෙන සමනළියක
විලස අරුණ සිතේ
කනට කොඳුර කොඳුර ගයන
මා නො ගැයුව ගීතේ
පිනට ලැබුණු මියුලැසියේ
සැතපෙන මගේ දෙනෙතේ

මල් පෙති පාවඩ අතුරා
ගෙට කැන්දන් එනවා
රොන්සුනු තවරා අඹරා
සුවඳින් නහවනවා
දැන් මට තේරෙන පාළුව
ඔබට බාර දෙනවා

දිමුතු නුවන් මිණි පරයා
හිනැහෙන සියුමැලියේ
මගේ හදවත එකලු කරන
ස්වර්ණ වර්ණ එළියේ
අපි නව ලොවකට පිවිසෙමු
සඳ තරු සැණකෙළියේ

සංගීතය -                                        පද -

අසන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# නිරෝෂා විරාජිනී - ඔබ ගියාම දුක මට දී

ඔබ ගියාම දුක මට දී
දුක දරා ගන්න නොහැකී
ටජ්මහල් සිහින ඉතිරි
සිත අනාත වී සරතී

ඔබ ගියාම දුක මට දී
හිරු හදිස්සියෙන් මියැදී //
ලොව සැනෙන් අඳුරේ ගිලුණී
හිරු උමතු දුකින් දැවුනී

ඔබ ගියාම දුක මට දී
ඔබ ගියා කියා නොසිතී //
ඔබ ගැනම සිහින පුරමී
දුක තුලද ඔබම දකිමී

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - නිලාර් එන්. කාසිම්

අහන්න ගීතය



www.studentlanka.com

# පියසිරි විජේරත්න අමිතා වැදිසිංහ - බැද්ද පුරා

බැද්ද පුරා සුදු රෙද්ද වගෙයි යස
ඉද්ද පනා මල් කැන් පිපිලා
සද්දේ මොකෝ අවුරුද්ද ඇවිල්ලද
නැද්ද කොබෙයියනේ රොන් හදලා

බැද්දට මල් වරුසාවක් වැහලද
නිල කොළ පිට ඒ මල් පොද ඉහිලද

පාර වටේ ඇති සේරම ගස්
සරු සාර හැඩයි ගෙඩි හට ගැනිලා ගෙඩි හට ගැනිලා
පේර දිවුල් පලු වීර ඉදී එන
වාරේ වගෙයි මේ පැණි පිරිලා

බැද්දට පැණි වරුසාවක් වැහලද
ගස් වල ගෙඩි පැණි වැස්සට තෙමිලද

රැන ගිරා සැළලිහිණි කුරුල්ලන්
සිනු හඩින් රස ගී ගයලා රස ගී ගයලා
තාන තනා තම් දාන කියා
එලි මාන වටේ කැරකේ නටලා

බැද්දට ගී  වරුසාවක් වැහලද
ගී පොද මේ පොට අස්සට පෙරිලද

සංගීතය -  පියසිරි විජේරත්න පද - හෙන්රි තෙන්නකෝන්

අසන්න ගීතය



www.studentlanka.com

# රෝහණ බැද්දගේ - පොඩි හාමුදුරුවෝ නෑ

මේ ගම්මානේ කඳුවැටි සීමාවේ
ලස්සන වන අරණේ තිබුනා සේනාසනේ
ඒ අසපුව හී වැඩවුන් ඒ කාලේ
පොඩි හාමුදුරුවෝ නෑ දැන් ඒ සේනාසනේ

අපේ පිනටම පහල වුනා සේ
සිල්වත් වූ ඒ පොඩි හාමුදුරුවෝ
බුදු සමිඳුන්ගේ සෙවනැල්ලක් සේ
පිඩු සිඟමින් වැඩියා ගෙන් ගෙට

මෙත් කරුණාවෙන් සිත් සනහාලන
සිල් සුවඳක් හමුවා දොරින් දොර
මේ ගම්මානේ සීමාවේ

ලස්සන වන අරණේ තිබුනා සේනාසනේ
ඒ අසපුව හී වැඩවුන් ඒ කාලේ
පොඩි හාමුදුරුවෝ නෑ දැන් ඒ සේනාසනේ

අපේ සිත් වල  පව් මල සෝදා
දහම් දෙසූ ඒ පොඩි හාමුදුරුවෝ
බුදු සමිඳුන්ගේ සෙවනැල්ලක් සේ
පිඩු සිඟමින් වැඩියා දොරින් දොර

සංගීතය - රෝහණ බැද්දගේ                    පද - රෝහණ බැද්දගේ

අසන්න ගීතය ( දෙවැනි ගීතය )



www.studentlanka.com

# රෝහණ බෝගොඩ - නෙතින් නෙත බලාලා

නෙතින් නෙත බලාලා හිතේ දුක නිවා
අදින් පසු නිවේවි අපේ ඒ කතා
රකින්නට සෙනෙහේ හඬන්නට එපා
නිමාවක් නොවේවි ඇරඹුමක් නිසා

ඈත් බව දැනිලා ඔබේ හා මගේ
දුරක් ආ නිසා දැන් දුකක් මේ වගේ
මහා සාගරේ සේ තිබුනත් හිතේ
කුමට හිමි වුනාදෝ නොහිමි ආදරේ

රකින්නට සෙනෙහේ හඬන්නට එපා
නිමාවක් නොවේවි ඇරඹුමක් නිසා

පතන්නට පවා මා වරම් අහිමි වූ
හැඟීමක් රිදුම් දේ හෙටට උරුම වූ
දින්නට කිසිත් නෑ ලොවේ මින් මතු
මගෙන් ඔබ ඈත් වී ගියායින් පසු

සංගීතය - ස්ටැන්ලි පිරිස් පද - දයා ද අල්විස්

අසන්න ගීතය



www.studentlanka.com

## රෝහණ වීරසිංහ නන්දා මාලිනි - රත්තරන් දූවේ

රත්තරන් දූවේ අපේ රත්තරන් දූවේ
ඔබයි දිවිය අර්ථවත් කළේ
ගියදා පටන් ඉගිළ කුරුළු කූඩුවෙන්
සන්තෝෂයක් නෑ සිතේ

ඉගිළිලා ගියේ සමුගෙන අපේ කූඩුවෙන්
නුඹත් කූඩුවක් තනන්න නේ
ඉගිළිලා ගොසින් තනපු කූඩුවත් අරන්
නැවත එන්න පියඹලා දූවේ

හනික එන්න පියඹලා දූවේ
ඇවිත් යන්න එන්න සුදු දූවේ

සංගීතය - රෝහණ වීරසිංහ පද -

අසන්න ගීතය

asokal@gmail.com

# රොමේෂ් සුගතපාල - දිගු දෑස දුටුවාම

දිගු දෑස දුටුවාම හැඟෙනවා පෙර සේම
උන්නු හැටි මගේ ගාව ඔය හිතට අමතකද
බිඳ දමා මගේ සිහිනේ ඇයි ද ඔබ හැන්ගේන්නේ
මට දෙන්න මගේ සිහිනේ ළඟ ඉන්න පෙර වාගේ

රෑ දිවා හිත පුරා ඇවිලිලා මේ ගින්න
තරු පවා අඬනවා ඔබට නෑ තේරෙන්නේ
හිතට හිත හිමි නැතිද අහනවා හිත මාගේ
මට දෙන්න මගේ සිහිනේ ළඟ ඉන්න පෙර වාගේ

පෙර එදා හමුවෙලා වෙලුනු හැටි මුදු පහසේ
පෙනෙනවා දකිනවා නිහඬ රෑ දුර අහසේ
දුරම මිස ළඟ නැතිද අහනවා නෙතු මාගේ
කවදාද ඔබ එන්නේ නැතුවාද හමුවන්නේ

සංගීතය - රොමේෂ් සුගතපාල පද - නන්දන වික්‍රමගේ

අසන්න ගීතය

# රොෂාන් ප්‍රනාන්දු - පුංචි ඇස් දෙක

පුංචි ඇස් දෙක  කඳුළු පුරවන් තවම මග බලනවා ඇති
ඒ වුනත් මට එන්න බැරි බව ඔයා තවමත් දන්නැති
මැරෙන්නට මොහොතක් තියා හරි ඔබ සොයාගෙන එන්නෙමි
එකටත් ලොකු කාලයක් ඇත කොහොම හරි හිත රවටමි

ප්‍රේමයේ උත්තරීතර බව පසක් කරගෙන හොඳටම
කාලයයේ වැලි තලාවට වී මියැදුනත් අපි සදහට
ආදරේ පෙම් කතා වලටත් එකතු වී ඇත අප ගැන
හඬා වැටුනත් හඬන්නට බැහැ හිතන්නේ මම ඔබ ගැන

දහසකුත් බාදක  තියාගෙන ප්‍රේම කරනා ඔය හිත
දාල යන්නේ කොහොමදැයි මට ලියා දෙනවද මතකය
සැකය කියනා වචනේ ගැනවත් හිතෙන්නේ නැහැ තව මට
නිදා වැටුනත් නින්ද යන්නෑ  හිතන්නේ මම ඔබ ගැන

සංගීතය -  රොෂාන් ප්‍රනාන්දු        පද -

අසන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# රොෂාන් ප්‍රනාන්දු - දුර ඈත රටක තනිවී

දුර ඈත රටක තනිවී

සිහිවෙන හැම මොහොතක් ගානේ
නෙතගට කඳුළු පිරේ
එන්න හිතයි පියඹා ඔබේ කුටියට
මාගේ කිරිල්ලියේ

සෙනේහයක් දැනුනා මට ඔබ ගැන
දුරස්ව ඉන්නා ටික කාලයේ දී //
නිවාඩුවක් ලද විගසම එන්නම්
ඔබ හා දොඩමලු වන්නට රහසින්

සිහිවෙන හැම මොහොතක්......

දුරකතනෙන් ඔබ අමතන විට දී
හිතට දැනුනේ අපමණ සතුටක් //
ඉවසිල්ලක් නෑ ඔබ වෙත එන්නට
දිවිය පුරාවට මගෙ කරගන්නට

සංගීතය - රොෂාන් ප්‍රනාන්දු පද -

අසන්න ගීතය

# සනත් නන්දසිරි - එදා මෙදා තුර

එදා මෙදා තුර කඳුලට විවරවූ - දෑස් පියන්පත් කවුළු වසා
ලයේ ගලා ගියා සෙනේහයේ සුව - සිනා පිරුණු රත් දෙතොල් පියා
මිලාන වී ගියා රෝස කුසුම් පෙති - කම්මුල් සුදුමැලි පාට පොවා
දෑත ලයේ බැඳ අවසන් ගමනට - සොඳුරිය මට නොකියාම ගියා

දෑස් කවුළු පත් පලා කඳුළු කැට - වෑහෙද්දී මගේ දෑස් අගින්
කාත් කව්රුවත් වෙතත් හිතයි මට - පාත් වෙන්න ඔය මුවට උඩින්
ඈත්ව යන්නට සමුගෙන කව්රුත් - ඔබේ මුව දොවතත් සුවඳ පැනින්
මාත් මගේ හිත ගත් ඔබ සුවඳයි - ඈත් නොවේමයි ඒ සුවඳින්

ඊයේ ඉපදී අද මිය යන්නට - පෙරුම් පුරාගෙන උපන් ලයේ
ඊයේ වේගෙන් අහස උසට බැඳී - ආදර ලෝකය හෙටත් තියේ
එත් ඉතින් දැන් සොඳුරිය ඔබ නැත - ඇයි මේ ලොව මා තනිව ගියේ
ආයේ දවසක එක හිත් ඇත්තන් - වී අපි ඉපදෙමු එකට පියේ

සංගීතය - සනත් නන්දසිරි පද - විමල් ජයශාන්ත

මේම ගීතය හා බැඳී ඉතාම ශෝචනීය කතාවක් ඇත.

මේ ගී පද රචකයා විමල් ජයශාන්ත මෙය රචනා කර ඇත්තේ
ඔහුගේ පෙම්වතිය මිය ගියා සෝකය දරා ගැනීමට අපහසු වූ නිසා.
ඔහු මෙය විශාරද සනත් නන්දසිරි අතට පත්කළ පසු එම ගීය සනත් ගේ
ලස්සනම ගීතය බවට පත්විය.
එත් අවාසනාවකට වෙනත් මෙවැනි අසාමාන්‍ය නිර්මාණයක්
කිරීමට පෙර විමල් ජයශාන්ත ගේ පළමු සහ අවසාන ගීතය
බවට මෙය පත් කරමින් ඔහු ඉතා තරුණ වියේ දීම අපගෙන් සමුගත්තා.
මෙවන් නිර්මාණයක් කල විමල් ජයශාන්තයනි ඔබට බොහෝ පින්. - අසෝක ලියනගේ

අහන්න ගීතය

# සනත් නන්දසිරි - මා හද අසපුව

මා හද අසපුව කුසුමෙන් සැරසුව
ඒ මල් බර දෑතයි
ජීවන මහ මඟ කැල්මෙන් එළිකල
ඒ නිල්මිණි දෑසයි
දකින තුරු සිත දැඩි අවිවේකයි

සෙනෙහස පොදි බැඳ හිසින් දරා
සැනසිලි පිණිදිය රැගෙන පෙරා.. //
සැතපෙන කුටියට ඇය ආ අන්දම
සුවඳ සිහිනයකි භවය පුරා

මුවින් අමොද බිඳු බිඳු වැහේ
සිතුම් පැතුම් එකිනෙක පෑහේ..//
දායාදය ලෙස අබැටක් නොපතමි
ඇගෙ නොකැළැල් හද මට සෑහේ

සංගීතය - සනත් නන්දසිරි පද - කරුණාරත්න අබේසේකර

අහන්න ගීතය



www.studentlanka.com

# ෂෙල්ටන් පෙරේරා - මිහිරැති වසන්ත කාලේ

මිහිරැති වසන්ත කාලේ කිම ඔබ මෙතෙක් නොආවේ
ගිම්හානයේ ගිලන් වී සිටිනේමි වේදනාවේ

සිතිවිලි සිතුම් සඳැල්ලේ ලතැවී රැඳී නිදැල්ලේ
මිහිරක් කොහේද ඇත්තේ කිව මැන මටත් වසන්තේ

දාහය ගතේ වෙලීලා කඳුලැලි නෙතින් ගලාලා
කඳුලැලි නෙතින් ගලාලා
ඈතට ආදී ගලා යේ සොයමින් ගෙවූ අතීතේ
සෙනෙහස ඔබෙන් උදා වූ යුගයකි ගෙවා නිමා වූ

සංගීතය - ෂෙල්ටන් පෙරේරා පද - ප්‍රේමකීර්ති ද අල්විස්

අහන්න ගීතය

# සිසිර ඉන්ද්‍රානි සේනාරත්න - නුහුරු නුපුරුදු

නුහුරු නුපුරුදු රහස පිලිබඳ මිහිර ආදරයයි  කියා
පවුරු බැඳගෙන සිතක වැජඹුනු රසවතී නෑ කොහි ගියා

ආදරෙයි මම ආදරෙයි දම්මි තවමත් ආදරෙයි
මවා පියකරු සිහින සිතුවම් මතු කළා රසබර හැඟුම්
දයාවන්තය යොවුන් සිතිවිලි රස කළා ඔබේ නෙත් කැළුම්

ආදරෙයි මම ආදරෙයි සුගත් තවමත් ආදරෙයි
අසිරිමත් ලෙස ඇඳුනු දේදුනු කළු වලාවෙන් යට වුනා
මිහිරියාවියේ අනේ දවසක ඔබේ හදවත ගොළු වුනා

ආදරෙයි මම ආදරෙයි දම්මි තවමත් ආදරෙයි
ආදරය එක අතක ප්‍රේමය  තව අතක මා මැදිවුනා
සාගරය වැනි වේදනාවක අහෝ හිතවත තනි වුනා

ආදරෙයි මම ආදරෙයි දම්මි තවමත් ආදරෙයි
ආදරෙයි මම ආදරෙයි සුගත් තවමත් ආදරෙයි
ආදරෙයි ආදරෙයි

සංගීතය - සිසිර සේනාරත්න පද -

අසන්න ගීතය

# <u>සෝමතිලක ජයමහ - එදා වාගේ අදත්</u>

එදා වාගේ අදත් පොද වැස්ස වැටෙනවා
මල් පිපුණු ගහ ගාව තවම ඉඩ තියෙනවා
නුඹ මගේ ළඟින් නැති අඩුව මට දැනෙනෙවා
මම තවම මට අහිමි මගේ කවිය ලියනවා

දුක පිරුණු මගේ හිත නුඹ හොඳට දන්නවා
හිත හදපු නුඹේ හඬ මගෙ සවන් සොයනවා
නුඹ නිසා පැමිණි දුක් පැණි රසයි සිතෙනවා
මම තවම මට අහිමි මගේ කවිය ලියනවා

අනාගත වාළුකා කතර මැද තනි වෙලා
කෙසේ පා ඔසවම්ද සා පවසා විඳ දරා
පුරපසක නොවී නුඹ අවපසක සඳ වුනා
මම තවම මට අහිමි මගේ කවිය ලියනවා

සංගීතය - සෝමතිලක ජයමහ පද -

අසන්න ගීතය

# සෝමතිලක ජයමහ - අවසාන සැඳා සක්මන

අවසාන සැඳා සක්මන නොදැනීම ගෙවුනු ඉක්මන
දැන් නික්ම යන්න කාලය අප අපෙන්
යළි හදාගන්න බැරි වුනු සිත් අරන්

අප සිනා සලු තැන්වල ගස් වැල්
මල් වරා හිඳීවි ද අප එන කල්
නැති වුනේ අපට අප මිස මේ ලොවට නොමැත එහි දුක
නාඩන්න ඉතින් නොසලා කඳුළැල්

අවසාන සැඳා සක්මන ......

අප දෙපා සැලු වෙරළේ රළ වැල්
කැටි ගැසී රැඳේවිද අප එන කල්
නැති වුනේ අපට අපමය කාලය කාලය යයි අප පසුකොට
නාඩන්න ඉතින් නොසලා කඳුළැල්

සංගීතය - සෝමතිලක ජයමහ පද -

අසන්න ගීතය



www.studentlanka.com

## සෝමතිලක ජයමහ නීලා වික්‍රමසිංහ - පියමන් කෙරුවෙමු

පියමන් කෙරුවෙමු  මහ වෙල් මැද්දෙන්
පෙම් බස් දෙඩුවෙමු උයන් කොනක හිඳ
ශිල්ප උගත්තෙමු නැණ ලැබ ගත්තෙමු
දෙපා වාරු නැත ඔබ හැර යන්නට

නිල තණ පලසෙහි ගැටුන දෙපාවයි
කෝල හැගුම් කෙලි කවට සිනාවයි
මල් නැටුමයි කළ ගෙඩි නැටුමයි
මගේ දෑස තුල යලිත් ඇදේවිද

නෙත කඳුලින් හස කැණින් මුවා කළ
සොඳුරු පැතුම් පුරවා මන මත කළ
මගෙ කෙළිලොල් විය ගෙවුණු වගයි
මා හැදු පාසල් මවුනි දයාබර

සංගීතය -   සෝමතිලක ජයමහ                    පද -

අසන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# සෝමතිලක ජයමහ - සඳ මඬලට හිනැහෙන්නට

සඳ මඬලට හිනැහෙන්නට එපා කියන්න
වසන්තයට යළි එන්නට එපා කියන්න
මගෙ පාළුව විඳ ගන්නට මට ඉඩ දෙන්න
ඔබ ඈතින් ඉන්න මතකෙට නැවිත් ඉන්න

ගං ඉවුරට මුමුණන්නට එපා කියන්න
තරු යායට ඉගිලෙන්නට එපා කියන්න
මං කෙලෙසක ඒ විසිතුරු බලා ඉදිම්ද
ඔබ ඈතින් ඉන්න මතකෙට නැවිත් ඉන්න

මල් පවනට දවටෙන්නට එපා කියන්න
මල් සුවඳට ලං වෙන්නට එපා කියන්න
මං කෙලෙසක ඒ සිහිලැල් දරා ඉදිම්ද
ඔබ ඈතින් ඉන්න මතකෙට නැවිත් ඉන්න

සංගීතය - සෝමතිලක ජයමහ පද -

අසන්න ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - අද දීගෙක යන නුඹ මට

අද දීගෙක යන නුඹ මට බුලත් අතක් දීලා
යන්න පිටත් වූ මොහොතේ මගේ දෙපා වැඳලා
එතෙක් සිනාවෙන් සිටි මා කොහේදෝ තනි වීලා
නෙතේ කඳුළු සිර කරගෙන සිටියෙමි ඉවසාලා

පුංචි නංගියේ මගේ පුංචි නංගියේ
පුංචි නංගියේ මගේ පුංචි නංගියේ

මා සිටියත් ඉවසාගෙන නෙතේ කඳුළු නොසලා
අප දෙන්නා දිහා බලා උන් අම්මා දැකලා
ඇගේ නෙතේ කඩා වැටුනු කඳුළු මතක් වීලා
කව්රුත් නැති තැනකට වී හැඬුවෙමි තනි වීලා

පුංචි නංගියේ මගේ පුංචි නංගියේ
පුංචි නංගියේ මගේ පුංචි නංගියේ

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - ධර්මසිරි ගමගේ

අහන්න ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - අහස පොලොව වට පිටාව

අහස පොලොව වට පිටාව හරිම හිස් තැනක්
ගහක් කොළක් දියක් නොමැති කාන්තාරයක්
ඇදී එන්න ඒ මොහොතේ හඬා වැටෙන හද මඬලට ඔබයි
මමයි ඉන්නා තැන කොහෙද තනි කමක්
නැහැනේ තනි කමක්

කණකා මිණකා තරුවක රුව
නොපෙනිණි ඔබ දකින තුරා
ලොවක සිරිය නුදුටිමි මම
ඔබේ සෙනෙහස ලබන තුරා

විලක දොලක සුව නොලැබීමි
ඔබ මා හා රැඳෙන තුරා
මලේ සුවඳ ඇත මසිතේ
ඔබ මා හා සිටින තුරා

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - යමුනා මාලිනි පෙරේරා

අහන්න ගීතය



www.studentlanka.com

# සුනිල් සහ දීපිකා - අහසයි ඔබ මට

අහසයි ඔබ මට නිම්හිම් නොපෙනෙන
ඉනි මං බඳිනු බැරි
පොළොවයි ඔබ මට තරුවක් විලසට
රෑ කල පතිත වෙමි

ගඟේ වතුර නැහැ ඉහළට ගලා ගියේ
අකුණු හඬින් නැහැ කඳු බිම් සසල වුනේ
ගඟ කවදා හෝ මුව දොර හමුවෙනවා
ලොව කැළඹුන දා කඳු බිම් හැකිලෙනවා

අනාත සයුරට වැසි දිය දෝත ඔබයි
අගාධ අඳුරක දුර රන් සිළුව ඔබයි
ඔබ මට ළඟ බව ඉඳුරා මම දනිමි
ඔබ වට කහවනු පවුරක මහා දුරකි

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - බන්දුල නානායක්කාරවසම්

අහන්න ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - අව පස අහසක

අව පස අහසක තරු ලකුණක් සේ
අපමණ සයුරක තුරු දසුනක් සේ
දිගු දිවි ගමනේ - කිම ඔබ රැඳුනේ

මාවත අවදිව නිමවා
දළ රළ පෙළ සැතපෙනවා
සැළමුතු සෙනෙහස මඳ පවනක් වී
ගැඹරේ නිම මුමුණනවා

දෝතට අසෙණිය ගවසා
ඔබ පෙර මග හිනැහෙනවා
විකසිත සිහිනේ සුබ කවියක් වී
දෙනෙතේ සිට ලියැවෙනවා

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - කුලරත්න අරියවංස

අහන්න ගීතය

# සුනිල් එදිරිසිංහ - චන්ද්‍ර මඬල බැද්ද වටින්

චන්ද්‍ර මඬල බැද්ද වටින් මෝදු වෙලා
කළු නැන්දගේ දුව යන්න ගියා
බැල්ම හෙලා - බැල්ම හෙලා

පාලු පැලේ අඳුර පිරේ
මගේ පැලට වරෙන්
හනික සෝබි නඟේ

දුරුතු මහේ සිසිල දැනේ
තනි හිතට මගේ
පාලු දැනෙයි නඟේ

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - කුමාරදාස සපුතන්ත්‍රී

අහන්න ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - දෙවැනි බුදුන් ලෙස

දෙවැනි බුදුන් ලෙස ලොවම වුවම් කළ
ලොවක පිදුම් ලද ලොවට උතුම් ලද
අම්මා ... අම්මා ... අම්මා ...

දෙසවන් සනහා මා නැලවූ ඔබ
මියුරු මියැසියේ අරුත කියා දුනි
ඒ මියැසිය අද මා ගයනා විට
මා සිප ගන්නට ඔබ මා ළඟ නැත

අම්මා ... අම්මා ... අම්මා ...

ඇසට හඬන්නට කඳුලැලි දුන් ඔබ
ලතැවුල් දරණා දිරිය ලබා දුනි
ඒ දිරියෙන් ලොව ජය ලබනා විට
මා සිප ගන්නට ඔබ මා ළඟ නැත

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - ආචාර්ය සුනිල් ආරියරත්න

අසන්න ගීතය

# සුනිල් එදිරිසිංහ - දෙවොලේ නොකැළැල්

දෙවොලේ නොකැළැල් පිදු ආදර මල්
සුවදින් මන කල් පිබිදෙමි හැම කල්

මලකින් මලකට ඇදෙමින් නොඉඳුල්
නිගා දේවයි පෙම් ලොවටම මිහිලොල්
එක මලකින් පමණක් රොන් ගන්නම්
අන් මල් මත නොතබා උණු කඳුළැල්

පවසට එල නැත සයුරේ රළ වැල්
දිය දෝතක් ගම් දොළකින් සිහිළැල්
පිඩිත වී සිටිනා සඳ අඳුරේ
ඔබ පමණයි ගෙන ආවේ හසරැල්

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - ආචාර්ය සුනිල් ආරියරත්න

අසන්න ගීතය

# සුනිල් එදිරිසිංහ - දූවේ නුඹ මගෙ ප්‍රාණයයි

දූවේ නුඹ මගෙ ප්‍රාණයයි
සැබෑ වුන සුබ සිහිනයි
සෙනෙහසින් කුල ගෙට පියනගන්නේ
සනුහරේ අභිමානයි

මම මලක් ලෙස නුඹ නොහැදුවේ
පෙති හැලි පරවෙන නිසාමයි
දුක දිනා හිනැහෙන හැටි දුවේ
නුඹ දැන උගත් පාඩම තමයි
මිල මුදල නිල බලය යා නොවෙයි
කළ හොඳම විතරක් ඉතිරි වේයි

අප මී මුතුන් මිත්තන් එදා
සිය ලේ කඳුළු දහදිය පුදා
පරපුරෙන් පරපුරට රැගෙන ආ
ඒ ගෞරවය මගෙ දුව තමා
නුඹ යන්නේ හිස් දෑතින් නොවේ
ගෙනියන්නේ ඒ අභිමානයයි
ගෙනියන්නේ ඒ අභිමානයයි

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - බණ්ඩාර ඇහැලියගොඩ

අසන්න ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - එපා යලි හමුවෙන්න

එපා යලි හමුවෙන්න ජීවිතේ ගමන් මග
ඔබෙන් මට උරුම වූ වේදනා කඳුළු ගඟ
හිරු සිනාසෙන ලොවක
පැතුම් මල් දෙවැට ළඟ
ඔබේ ජීවන සුවඳ අරන් ඇතට  යන්න

සංසාර ගමන් මඟ සෙනෙහස සොයා දිනෙක
ආ ගමන නිමා කළ ඔබේ හදවත ගාව
සෙනෙහසේ අවසාන කඳුළු බිඳුවක  පහස
ගලා යයි අතීතේ මිය ඇදුනු සොහොන ළඟ

ඔබ මවෙත තිලිණ කළ ඔබේ බැති බර සුවඳ
මගේ මතකය වසා සදාකල් රැඳෙනු ඇත
සංසාරයේ යලිදු නවාතැන් සොයා යන
මගේ මල ගම දාට ඇවිත් යන්නට එන්න

සංගීතය - කරුණාරත්න විජේවර්ධන        පද - දීශාන් නානායක්කාර

අසන්න ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - ගඟ තවම ගලයි

ගඟ තවම ගලයි
ගං දැල නිසසලව බලා හිඳී
ඔබ ගඟක් වගේයි
සිත් දැලවරින් ඇතටම ඇදෙයි

මහා වැස්ස වැටි ගඟ දිය කැළඹෙයි
ගං ඉවුරු නොහුරු රිදුමකින් සැලෙයි
ගඟ ඔහොම තමයි එක තැන නොරැඳේයි
ඔය හදේ රැඳුනු ආදරය වගෙයි

කඳු යාය නිලෙන් නිල අහස වසයි
ගං දියෙන් වැසී හිත තවම බරයි
කඳු පෙළ නිසලයි කිසිදා නොසැලෙයි
මා ඔබට පිදූ ආදරය වගෙයි

සංගීතය - නාලක අංජන කුමාර පද - රංජිත් රූපසිංහ

අසන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - හදේ කොතැනක

හදේ කොතැනක හෝ හිඳී ඔබ
නිදා නොනිදා මෙන්
බලා අවසර සොයා කල් මැන
වෙලා හස රැහැනින්
පෙළයි මා මුදා සුව දැහැනින්

සයුර ඉම රත් සිතිජ රේඛාවේ
මියෙන හිරු සේ ගිලී බිම් අඳුරේ
තලා මා සිත පලා ගිය ඔබ
දවයි මා අද තනි වෙනා මොහොතේ

උතුම් පිවිතුරු ප්‍රේමයේ නාමෙන්
සහස් සුවහස් පැතුම් බල මහිමෙන්
ඉනු කඳුලද සිඳෙන්නට පෙර
යදින්නම් ඔබ මැකී යනු මතකෙන්

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - කරුණාරත්න සපුතන්ත්‍රී

අසන්න ගීතය

# සුනිල් එදිරිසිංහ - හිදීවි කොතැනක හෝ

හිඳීවි කොතැනක හෝ
හිමි කාරයා උපන් ඔබේ නමින්
වඩීවි  කෙදිනක හෝ  ඒ එන තුරා
හිත හදාගෙන ඉඳින්

ගඟකට සයුරක් මුණ ගැසේවි
රළකට වෙරලක් මඟ හිඳීවි
නියඟට වැස්සක් ඇද හැලේවී
නුඹටත් කෙනෙක් හිඳීවි - දවසක හොයාන එවි

අකුලක පිපෙන නැවුම් මලක් සේ
නදියක නැගෙන තරංගයක් සේ
නළලට සිහිල පවන් රොදක් සේ
නොසිතුව විටක ලඟා වී - නුඹ විඳි අඳුර නිවවී

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ        පද - කුලරත්න අරියවංස

අසන්න  ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - කළේ පැන් ඇත

කළේ පැන් ඇත නැවුම් රහ නැත
මොකද මන්දා ලිඳට වුයේ
පුළුස්සා ගත් රොටිය කර වී
මොකද මන්දා ලිපට වුයේ
හදා ගත් ලුණු මිරිස රහ නැත
මොකද මන්දා දිවට වුයේ

සැලේ ගහ කොළ සුවඳ ඇත එද
සිහිල කොයි අත ගියාදෝ
කෝල බව මුසු සිනා හඬ නැත
සවන් බිහිරිව ගියාදෝ

පුරුදු නිවහන නුහුරු වී නම්
කාට ඒ ගැන කියන්නෙම්
කාට මේ ගැන කියන්නෙම් මම
බිරින්දෑ නෑ ගම් ගොසින්

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ        පද - කේ ඩී කේ ධර්මවර්ධන

අසන්න ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - කව්රුන් ද ඔබ මගේ

කව්රුන් ද ඔබ මගේ - කව්රුන් ද මා ඔබේ
කව්රුන් ද ඔබ මගේ - කව්රුන් ද මා ඔබේ

දෙතොල් සලා මුදු සිනහ නඟන්නේ
දෙනෙත් පුරා පිරි කඳුළු සලන්නේ
හදවත් ගැහෙනා රිද්මය අතරේ
ගතින් සිතින් එක්තැන් වී ඉන්නම්

ප්‍රේමය ගොළු වී හඬා වැටිලා
ඔබ හද මා හද රිදවන මොහොතේ
ජීවිතයට හුරු පැරදුම හමුවේ
නොදොඩා ගොළුවී බලා සිටින්නම්

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - සමන් අතාවුදහෙට්ටි

අසන්න ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - මේ තරම් සියුමැලිද

මේ තරම් සියුමැලිද කළු ගල්
හිතන්නට වත් බැරි නිසා
මම ගියා අව්කන බුදුන්ටත්
දැස් දුන් මිනිසා සොයා
දැස් දුන් මිනිසා සොයා

කලා වැව ළඟ ඉලුක් හෙවනක
මැටි පිලක පැදුරක් එලා
රිදුම් පිරිමදිමින් බලයි ඔහු
මැරෙන ඉපදෙන රළ දිහා

ඉසුරුමුණියේ නුඹ තැනූ
පෙම්බරිය කොතනද කියා
මා අසු විට හිනැහුනා ඔහු
තවම තනිකඩ යයි කියා

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - රජී වසන්ත වෙල්ගම

අසන්න ගීතය

# සුනිල් එදිරිසිංහ - සදාකාලික නොවූ ලෝකේ

සදාකාලික නොවූ ලෝකේ

සදාකාලික ප්‍රේමයක්

සොයා නෙක ගම් දනව් පීරා

ගෙවූ කාලය සිහිනයක්

මගේ දුක දැන ඔබේ දෙනයන

උපන් කඳුලින් සේදිලා

ඔබේ වත නොව ඔබේ හදවත

පුරා සඳ සේ පෑදිලා

එදා ළඟ සිට දුටුව ඔබ නොව

මෙදා දුර සිට මා දකින්නේ

සදා කාලික නොවූ ලෝකේ

සදා කෙලෙසද පෙම් බඳින්නේ

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - ආනන්ද අමරසිරි

අසන්න ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - සිනහ වෙනු මැන

සිනහ වෙනු මැන වේදනා පිසදා
වේදනා පිසදා

වෙරළ රළ හා තරහ වී නැත
මියුරු සර වෙණ හා බිඳී නැත
අහස සඳ හා උරණ වී නැත
අතීතය මගෙ හදවතේ නැත

කඳුල දොම්නස නසන්නට නම්
බඹර ගුම් නද අසන්නට නම්
මියුරු ගී කවි ගයන්නට නම්
වසන්තය ගැන සිතන්නට නම්

සිනහ වෙනු මැන.....

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - කේ ඩී කේ ධර්මවර්ධන

අසන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - සොයා පිළිසරණක්

සොයා පිළිසරණක් ලොවෙන් මා
නොලැබ හව් හරනක්
හවෙන් හවයේ පතා ආවෙමි
හිමියනේ ඔබේ - ඔබේ බුදු වදනක්

ගෙවා සුවහස් යොදුන් මේ කතරේ
සොයා යන මං නොදැන මේ අඳුරේ
යුගෙන් යුගයේ පතා ආවෙමි
හිමියනේ ඔබේ - ඔබේ බුදු සිහිලක්

මහා කරුණා නුවන් දිය ගැඹරේ
ගිලී සැනහී නිවා ගිනි සසරේ
පහන් වැට සේ සොයා ආවෙමි
හිමියනේ ඔබේ - ඔබේ නෙතු කැල්මක්

සංගීතය - වික්ටර් රත්නායක පද - කරුණාරත්න සපුතන්ත්‍රි

අසන්න ගීතය

# සුනිල් එදිරිසිංහ - වියෝ වූ පසුවයි

වියෝ වූ පසුවයි දැනෙන්නේ
ප්‍රේමයේ අභිමන්
හැඬූ දා කඳුලයි දකින්නේ
සිනාවේ සරදම්

ඉවුරු දැලේ හිඳ බැලූ විට
ගඟ හැඩයි කදිමයි
දියට වන් විට එවන් ගඟුලම
බිහිසුණුයි චණ්ඩයි

හඳක් නැති දා අහස් තලයට
තරුව දෙයි සැනසුම්
පුන් පොහෝ දා එවන් තරුවම
ලබන්නේ ගැරහුම්

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ පද - බන්දුල නානායක්කාරවසම්

අසන්න ගීතය



www.studentlanka.com

## තිලකසිරි ප්‍රනාන්දු ( කිත්සිරි ජයසේකර ) - එන්න මදනලේ

එන්න මදනලේ ගොස් පවසන්න දුක මගේ
යන්නට හැකි ඔබට පමණි සිර ගෙයට ඇගේ
දිවා රෑයේ වැලපිලා දෑස ඇගේ රතු වෙලා
කියන්නකෝ මගෙ දුක ඇගේ කනට ලං වෙලා

සෝක පණිවුඩය යවන්න ආදරිය බලා
කාලිදාස කිවිඳු මේඝ දූතයක් කළා
මට කොහින්ද එම වලා ආවේ ආමි සුළගේ ඔබ බලා
කියන්නකෝ මගෙ දුක ඇගේ කනට ලං වෙලා

සංදේශයකින් යවන්න මෙදුක උන් අතේ
හංස ගිරා ලිහිණි කොවුල් කොබෙයියන් නැතේ
සුළගේ මා අසරණයි මට ඇති වස්තුව ඇයයි
කීවොත් මගෙ දුක සදහට ඔබට මා නයයි

සංගීතය - පද - කරුණාරත්න අබේසේකර

අසන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# ටී එම් ජයරත්න - සියක් ආයු ලැබ

සියක් ආයු ලැබ මගෙත් ආයු ගෙන
මටත් වඩා කල් ඔබ ජීවත් වේවා
මෙතෙ බුදුන් කල ලොවේ උතුම් ලඳ
විශාකාව වේවා

මහා පොලොව සේ නිහඬ නිසංසල
ඔබේ දයාබර හදින් ගලා එන
ආදර ගීතය ලොව සනහා ලන
බුදු බණ පදයක් වේවා

ගතේ රුහිරු ලේ කිරි පෙව් සෙනෙහස
සුවඳ ගලා ගිය ඔබේ මව් හදවත
නිවන් පුරට යන මං පෙත හෙළි කල
පහන් ටැඹක් වේවා

සංගීතය - පද -

අසන්න ගීතය

# ටී එම් ජයරත්න  නීලා වික්‍රමසිංහ - සුදු මුතු රළ පෙළ

සුදු මුතු රළ පෙළ කිඳුරු කොදෙව්වේ පාවඩ පලස එලා
සිඳු ලඳ ගෙන දුන් මුතු කැකුළක් සේ ඔබ තිලිණ වෙලා

යුග දිවි වැල්ලේ අඳුරු ඉසව්වේ මුකුලිත සිතැඟි සලා
අරුණැල්ලක් සේ  අරුණැල්ලක් සේ නුඹ මිණ පායා
සනහස ජනිත කළා

සුදු මුතු රළ පෙළ කිඳුරු කොදෙව්වේ පාවඩ පලස එලා
සිඳු ලඳ ගෙන දුන් මුතු කැකුළක් සේ ඔබ තිලිණ වෙලා

සැඩ රළ රැල්ලේ සැලෙන කැදැල්ලේ රැඳුනෙමි සරණ සොයා
පවනැල්ලක් සේ නොම හැර ආවෙමි ඔබ හද සදෙන තුරා

සංගීතය -

පද -

අසන්න ගීතය

asokal@gmail.com

www.studentlanka.com

# වික්ටර් රත්නායක - මම තරහා නෑ

මම තරහා නෑ

ප්‍රේම පත්‍ර බොළඳ වචන කුළු ගැන්වූ ආදරයක්
සිටු මැදුරක විසූ ඔබට මගේ පැලේ ඉඩ මදි නම්
කුමාරයෙක් අත ගන්නට වේවි වාසනා
හිතට දුකක් ඇති වෙනවා ඒ වුනාට නෑ කමක් නෑ
මම තරහා නෑ මම තරහා නෑ

අමෘතයද ද ඉවත හෙලයි හිත නැතිනම් මුව තැබුමට
ඉරණම එය විසඳනු ඇත මටත් කලක් උදාවේවී
රැහැන් වෙලා බැඳ ගන්නට බැහැනේ ආදරේ
හිතට දුකක් ඇති වෙනවා ඒ වුනාට නෑ කමක් නෑ
මම තරහා නෑ
මම තරහා නෑ

සංගීතය - වික්ටර් රත්නායක පද -

අසන්න ගීතය

asokal@gmail.com

# වික්ටර් රත්නායක - නිවන් දුටු හිමි

නිවන් දුටු හිමි රුවන් පිළිරුව පමණී මට අද ශේෂ වූයේ
හිමි දෙසූ බණ අසා අසා ඇති මුදු ඇසුයේ හිමිගේ හඬින් නොව
අනේපිඩු සිටු පුතුට මෙන් අනේ හිමියනි මටද දැන්
දෙසා වදහල මැනවි බුදු බණ මහා කරුණාවෙන්
මහා කරුණාවෙන් මහා කරුණාවෙන්

ගලක් වී නම් මමත් ඉවසමි යගුලු පහරද කැපී වෙන්වෙන
ඔබේ පිළිරුව නිම කරන්නට කලා කරුවෙකු අතින් ලැබෙනා
එයින් හිමි හුරු කලා වූ ශාන්තිය මට ලැබේවා
මහා කරුණාවෙන් මහා කරුණාවෙන්

මලක් වන්නට නොහැක හිමියනි මිනිස් බව ලබ සිටින මා හට
මලක් අද ඔබ දෙපා පාමුල විදින විදින සිහිලස නොමැත මා හට
මලක් වූ දා මගේ ජීවය ඔබේ පාමුල පරවුනාවේ

සංගීතය - වික්ටර් රත්නායක පද - ප්‍රේමකීර්ති ද අල්විස්

අසන්න ගීතය



www.studentlanka.com

# වික්ටර් රත්නායක - පෙම්බර මධු මගේ

පෙම්බර මධු මගේ මා නැතේ ඔබෙන් මිදුනේ
සුරූපී දේහ විලාසේ මැවේ මැවේ නයනේ
පෙම්බර මධු මගේ පෙම්බර මධු මගේ

ලොවේහි ඇත අන්නතේ පැලක් තුලේ නොපෙනී
ඇතත් හොරෙන් හැන්ගීලා මගේ දුකත් නොදැනී
අරන් එමි ඔබ කැන්දා ඇසිල්ලකින් පැමිණී
සුරූපී දේහ විලාසේ මැවේ මැවේ නයනේ
පෙම්බර මධු මගේ පෙම්බර මධු මගේ

වඩාලා දෝත පුරාලා පරෙවි කුමාරිය සේ
සුගන්ද මල් යහනාවේ හොවා පෙමින් සිතුසේ
පවන් සලා ඔබ සනසම් ලදල්ලකින් සුවසේ
සුරූපී දේහ විලාසේ මැවේ මැවේ නයනේ
පෙම්බර මධු මගේ පෙම්බර මධු මගේ

අපේම පාළු විමානේ නිසංසලේ සහනේ
අමා පැණින් මත් වීලා ඔබේ දෙතොල් බඳුනේ
විඳින්නෙමි රස මදිරා පෙරුම් පිරූ ලෙසිනේ
සුරූපී දේහ විලාසේ මැවේ මැවේ නයනේ
පෙම්බර මධු මගේ පෙම්බර මධු මගේ

සංගීතය - වික්ටර් රත්නායක පද - කරුණාරත්න අබේසේකෙර

අසන්න ගීතය



www.studentlanka.com

# විජය කුමාරණතුංග චන්ද්‍රලේඛා පෙරේරා - සැරයටියෙන් අපි යනෙන තුරා

සැරයටියෙන් අපි යනෙන තුරා සංසාරේ අපි එකට ඉමු
සංසාරෙන් අපි සමුගන්නා දා ඒ ගමනත් අපි එකට යමු //

ජීවන මං පෙත මලින් සැදී ගිය යුගයක නොව ඔබ හමු වුයේ
කටු කොහොලින් පිරි කළල් දියේ මා තනිව මියෙද්දිය හමු වුයේ
මින් මතු මං පෙත මලින් සදන්නෙමි ලතැවුල් සෝ ගී නැසෙන සේ
පමණක් නොව මේ සංසාරේ උපදින වුව මතු සංසාරේ

මතු සංසාරේ මා සුරුැඹුහුටිව පෙම් කරනා කල එළඹෙන දා
කුලුදුල් නැකතින් හමුවන පැතුමක් පතනෙමු සසරෙන් නික්මෙන දා
සංසිඳුවා සිතු පහන් කරන්නෙමි මේ පෙම කුලුදුල් පෙමය සිතා
එන්නෙමි පසුපස සංසාරේ කැපවෙමි ඔබ සිතු ගැනම සිතා

සංගීතය -                                        පද -

අසන්න ගීතය


www.studentlanka.com

# විජය කුමාරණතුංග - රුස්ස ගහ ළඟ

රුස්ස ගහ ළඟ පාලු මාවතේ
කළුවර යාමේ කළු ගඟ අයිනේ
කව්රුද ඇතින් මා අමතන්නේ
ඔබේ සුවඳ දෝ සිත දැවටෙන්නේ

එහා තොටෙන් ඔබ පාරුව පැදගෙන
මෙහා තොටට එයි මා හමුවන්නට
දෙදෙනා පෙම් කල මේ ගං තොටුපොල
සිහින නගරයකි ඔබ මා වෙන්කළ

පාරුව පෙර මෙන් ගඟ මැද පෙනුනා
පියවර හඬ මා අසලම ඇසුනා
ඡායාවකි මෙය මායාවකි එය
සසර පුරා ඔබ ඇතට ඇදුනා

සංගීතය - පද

අසන්න ගීතය

මෙම ගී පොත PDF (Portable Document File ) ආකාරයට සැකසී ඇති නිසා ඔබට මෙම පොත
මුද්‍රණය කර තබා ගැනීමට හැකිය. ඔබ මෙහි එන
සමහර ගීත අසා නොමැති නම් ඔබේ පරිගණකය
අන්තර් ජාලයට සම්බන්ද කර
" අසන්න ගීතය" සම්බන්දය හරහා YOUTUBE මගින් එම ගීත (100)
සවන් දීමට හැකිය.

මෙම ගී පොත සැකසීමේදී Sinhala Uincode → Iskoola Pota නමැති අකුරු පද්දතිය යොදාගෙන ඇත.

සමහර ගීත වල පද රචනය සහ සංගීතය සැපයු විශිෂ්ට කලා ශිල්පීන්ගේ නම් නොදැනීම විශාල අඩුවක් සේ මා දකී.

ඔබ ඔබ ළඟ ඇති සංයුක්ත තැටි මගින් එය මට ලැබීමට සලස් වන්නේ

නම් කෘතඥ වෙමි.

Asoka Don Liyanage

Mississauga

Ontario

Canada

asokal@gmail.com



www.studentlanka.com